# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය


මෙත් සවිය සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව METHSAVIYA NEWSLETTER

මෙත් සවිය 22 වන කාණ්ඩය | 41 වන කලාපය | 2025 අප්‍රේල්


නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙත් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා




"මෙත් සවිය සඟරාව" අංක QD/පුවත්/104/2025 යටතේ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත.


ඉරු දින වල භාවනා වැඩසටහන් පැවැත්වෙන ස්ථානය හා ලිපි එවිය යුතු ලිපිනය :
අංක 55, ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08.

සෑම මසකම ප්‍රථම ඉරු දින වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ධම්ගවේෂී බෞද්ධාශ්‍රමය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.


මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය - ශ්‍රී ලංකාරාමය, නො.55, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08. දුː කඃ 0714014467, 0112505088
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org විද්‍යුත් තැපෑල : office@methsaviya.org



## තිස්සමහාරාම රාජමහා විහාරස්ථානයේ සර්වඥ ධාතූන් වහන්සේලා සහිත පෞරාණික ධාතු මන්දිරය සහ බුද්ධ මන්දිරය ප්‍රතිසංස්කරණය සඳහා ඔබත් දායක වීමට කැමතිනම් විමසන්න.

බුදු හිමියන්ගේ පාදස්පර්ශයෙන් පහස ලද ඓතිහාසික තිස්සමහාරාම රාජමහා විහාරස්ථානයේ චෛත්‍ය ප්‍රවිශ්ඨයේ, පිරිවැය නොමැති බැවින් ඉතා බලවත් සේ ගරා වැටීමට ලක්ව ඇති, සර්වඥ ධාතූන් වහන්සේලා සහිත පෞරාණික ධාතු මන්දිරය සහ බුද්ධ මන්දිරය (වහලය, බිම සහ බිත්ති) ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඔබත් දායක වීමට කැමති නම් විමසන්න.

☎ **0714 0144 67, 0112 50 50 88**


**මෙත් සවිය** මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය : නො: 55, ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08.
මාසයේ ප්‍රථම ඉරු දින වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ධම්ගවේෂි බෞද්ධාශ්‍රමය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org
විද්‍යුත් තැපෑල : office@methsaviya.org
☎ 0714 0144 67, 0112 50 50 88

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

මෙත් සවිය භාවනා මධ්‍යස්ථානය

දුඃකඃ 0714 014467, 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපෑල : office@methsaviya.org

ඉරු දින වල භාවනා වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08

සෑම මසකම ප්‍රථම ඉරු දින වැඩසටහන් පැවැත්වෙන ස්ථානය : ධමගවේෂි බෞද්ධාශ්‍රමය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07


## මෙත් සවිය 2024/ 2025 වසර සඳහා විධායක කමිටුව

**ගරු පැවිදි අනුශාසක**

බොරැල්ල ශ්‍රී ලංකාරාම විහාරාධිපති, අතිපූජ්‍ය වීරගොඩ ඤාණ ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**ගරු සභාපති**

විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරී, විද්‍යාවාචස්පති, දේශමාන්‍ය,
විශ්ව විද්‍යා අධිමනෝවිද්‍යාවේදී, නාලන්දා කීර්ති ශ්‍රී මහාචාර්ය චන්දන ජයරත්න මහතා.

දුඃක : 0714800800, ෆැක්ස් : 0112 515 615 / විද්‍යුත් ලිපිනය : chandanajayaratne@gmail.com

**ගරු උප සභාපති**

කෝසල එදිරිසිංහ මහතා — දූ.ක : 071 632 2306

නිමේෂ් සශින්ත මහතා — දූ.ක : 077 977 9963

**ගරු සම ලේකම්වරු**

වේනුක ජයනාත් මහතා — දූ.ක : 071 433 3868

එස්. ජී. මධුරංග මහතා — දූ.ක : 075 011 0600

**ගරු භාණ්ඩාගාරික**

චින්තක බණ්ඩාර මහතා — දූ.ක : 071 811 4477

**ගරු උප භාණ්ඩාගාරික**

මංජුල පත්මකුමාර මහතා — දූ.ක : 071 529 5855

**ගරු සංස්කාරක**

එම්. කේ. ප්‍රියන්ත මහතා. — දූ.ක : 071 228 5680

**ගරු කාරක සභිකවරු**

පියල් චන්ද්‍රතුංග මහතා 071 450 1358 / චමින්ද ඉන්දික මහතා 071 229 9212 / පූර්ණ ප්‍රදීප් මහතා 071 905 8023 /මාලන් කන්දගේ මහතා 077 277 2601 පණ්ඩුල ගුණසේකර මහතා 071 946 2837/ අංජන මැන්ඩිස් මහතා 075 355 8474

**වෙබ් අඩවි කමිටුව - සභාපති**

සමීර දයානන්ද මහතා — දූ.ක : 0772 347 157

**කාන්තා එකමුතුව - සභාපතිනිය**

රංජනී උඩුගොඩ මහත්මිය — දූ.ක : 0777 613 659

**තරුණ කමිටුව - සභාපති**

සුරත් චතුරංග මහතා — දූ.ක : 0717 744 297

**අසරණ සරණ කමිටුව - සභාපති**

අමල් බණ්ඩාර මහතා — දූ.ක : 071 603 8639

**සුව සෙත කමිටුව - සභාපති**

අතුල නානායක්කාර මහතා — දූ.ක : 0714 078 429

**දාන - ශීල - භාවනා කමිටුව - සභාපති**

නිහාල් මැන්ඩිස් මහතා — දූ.ක : 0718 266 143

**අධීක්ෂණ කමිටුව**

පී.පී. පෙරේරා මහතා — දූ.ක : 0719 441 269

වික්‍රම ගුණදාස මහතා — දූ.ක : 071 221 0620

**පර්යේෂණ කමිටුව - සභාපති**

ආචාර්ය පද්මකුමාර මහතා — දූ.ක : 071 843 3319

**මෙත්සවිය TV / මාධ්‍යජාලය - අධ්‍යක්ෂිකා**

චම්පාවෝ ජයකුමාරි මෙනෙවිය — දූ.ක : 0702 117 913

**කළුතර ශාඛාවේ සභාපති**

නිහාල් මැන්ඩිස් මහතා — දූ.ක : 0718 266 143

**සාමණේර භික්ෂු පුහුණු වැඩසටහන හා පෙර පාසල් සම්බන්ධීකාරක**

රුෂාන්ති දසනායක මහත්මිය — දූ.ක : 0701 558 558

**අප ගැන වචනයක්**

**මෙත් සවිය සංසදය, නිරවුල් මනසක් ඇති, වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් වසර පහළොවකට පෙර අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි.** වර්තමාන සාමාජික සංඛ්‍යාව 7,500 ඉක්මවා ඇත. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මේ මඟින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යයාස හා භාවනා වැඩසටහන් වැනි ඒ ඒ කාලවල දී පවත්වන වැඩසටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක්, දාන - සීල - භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටුව හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ප්‍රධාන මූලස්ථානය ලෙස පවත්වා ගනිමින් දහ හත් වසරක් සහ බොරැල්ල ශ්‍රී ලංකාරාමය මූලස්ථානය කරගනිමින් වසර 4 ක පමණ කාලයක් **"මෙත් සවිය මෛත්‍රී සංසදය"** පසුගිය විසි එක් වසරක් පුරා සමථ විපස්සනා භාවනාව හත් දහස් පන්සියයකට අධික පිරිසකට උගන්වා ඇති අතර, ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කර ඇත. මීට අමතරව බෞද්ධ භාවනාවේ ප්‍රයෝජනය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ පවත්වමින් දෙස් විදෙස් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලට එම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලබන, අප දන්නා පරිදි ලංකාවේ ඇති එකම ආයතනය ද **"මෙත් සවිය"** වේ. (මින් සමහරක් අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක). තවද මිරිසවැටිය සළපතල මළුව ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීම, නාගදීප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වසර 30 ක දිගු යුද්ධය නිම වී මාස 06 ක් යාමට පෙර නාගදීපය සහ කිලිනොච්චියේ ලුම්බිණි විහාරයේ වැසිකිළි පද්ධතීන් සාදා නිම කොට පූජා කිරීම, මහියංගන රාජමහා විහාරයේ ලක්ෂයකට වැඩි පිරිසකට පිරිසිදු ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම, ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහල වීම සහ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවී වසර 2600 ක් ඉක්මවීම සැමරීම සඳහා ඓතිහාසික මහියංගන රජමහා විහාර පුදබිමෙහි අඩි 102 ක් උසැති **"මෙත්සවිය 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුදු පිළිමය"** ඉදි කිරීමේ කටයුතු 2012-01-08 දින ආරම්භ කර වසර 11 කට පසු 2023-05-28 දින වන්දනාමානය සඳහා විවෘත කරන ලදී. එසේම රෝද පුටු පරිත්‍යාග කිරීම, කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහරගම අපේක්ෂා රෝහල (පිළිකා රෝහල) ඇතුලු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම වැනි ලොකු කුඩා සත්කාරයන් රැසක් පසුගිය 21 වසරක් පුරා ඉටුකර ඇත.

**සියලු ලෝ සතුන්ගේ සිත්තුල මෛත්‍රිය පැතිරේවා.....!**

# සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

## මෙත් මෙත් සවිය මගින් නොමිලයේ උගන්වන "මෙත් සවිය ළදරු පාසලට" ( ශිෂ්‍යත්ව සහ පාසල් උපකරණ පරිත්‍යාග කල හැක.)

මෙත් සවිය කළුතර ශාඛාවේ අධීක්ෂණය යටතේ පැවැත්වෙන අභිනවයෙන් ඉදිකල ගොඩනැගිලි, වැසිකිළි, ක්‍රීඩා උයන සහිත මෙත් සවිය කළුතර පෙර පාසැල 2021 අප්‍රේල් 18 වන ඉරුදින පෙ.ව. 10.00 ට උත්සවාකාරයෙන් ඇරඹින. එය පිහිටා ඇත්තේ කළුතර හොරණ පාරේ පරදූව තෝරගල්ල සිරි සදහම් අරණ විහාර භූමියේ ය. පූජ්‍ය සුගතානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසකත්වයෙන් හා මෙත් සවිය කළුතර ශාඛාවේ අධීක්ෂණයෙන් පැවැත්වේ.

නිතර ගංවතුරට යටවන මෙම පෙදෙස්වල ඉතා දරිද්‍රතාවයෙන් පෙලෙන පවුල් වල ළමුන් සඳහා ඉංග්‍රීසි හා සිංහල භාෂා මාධ්‍ය දෙකෙන් ම පෙර පාසැල් අධ්‍යාපනය ලබාදීමට කටයුතු සංවිධානය කර ඇත. ළමුන් 40 ක් දක්වා ඉගැන්වීමේ පහසුකම ඇති මෙම පෙර පාසැලේ අධ්‍යාපන කටයුතු සියල්ල නොමිලයේ සැපයේ.

නොමිලයේ සපයනු ලබන ඇඳුම් කට්ටල, සපත්තු, පාසල් උපකරණ, ක්‍රීඩා භාණ්ඩ මෙන්ම විහාරස්ථානයේ හා පෙර පාසලේ විදුලි බිල්පත් - ජල බිල්පත් හා පෙර පාසැල් ගුරුතුමිය හා පාලිකාවගේ ගෙවීම් යනාදිය සඳහා සෑම මසකම බරපැන රු.35,000/- ඉක්මවයි.

අධ්‍යාපනය ලබා දීම සඳහා සෑම මසකම ඉහත මුළු මුදල ම හෝ එක් ළමයකු සඳහා රු.1,500/-ක ශිෂ්‍යත්වයක් ලබා දී ප්‍රඥාකාරක කුසල් ලබනු කැමති පිංවතුන් වෙතොත් කළුතර ශාඛාවේ සභාපති - හිටපු පොලිස් පරීක්ෂක නිහාල් මෙන්ඩිස් මහතා (071 826 6143) හෝ කළුතර සදහම් අරණ වැඩසටහන් සම්බන්ධීකාරක රුෂාන්ති මහත්මිය (071 643 4248) හෝ අමතන්න. පෙර පාසල 2021 අප්‍රේල් මස 19 වන දින සිට මේ දක්වා සතියේ දිනවල නොකඩවා පැවැත්වේ.

## 2025 මැයි මස 04 වන ඉරු දින, මෛත්‍රී භූෂණ සම්මාන උළෙල සහ වාර්ෂික මෙත් සවිය මහ සභා රැස්වීම

### ආරාධනාවයි..!

**2025 මැයි මස 04 වන ඉරු දින**

කොළඹ, විශ්ව විද්‍යාලයේ විද්‍යාපීඨ පරිශ්‍රයේ නව කලාගාර ශාලාවෙහි

ප.ව. 4.40 ට, පවත්වනු ලබන,

මෙත්සවිය 22 වන සාංවත්සරික මහාසභා රැස්වීමට

ඔබට කරනු ලබන සුහද ආරාධනාවයි...!

එදින ප.ව. 1.15 - 5.00 දක්වා,
ධර්ම දේශනාව සහ
මෛත්‍රී භූෂණ සම්මාන උලෙළ පැවැත්වේ.
ඉන් අනතුරුව පැවැත්වෙන මහ සභා රැස්වීමේ
න්‍යාය පත්‍රය මෙයයි

01. ආජීව අෂ්ඨමක සීලය පිහිටවීම.
02. මෙත් සවිය තේමා ගීතය වාදනය කිරීම
03. න්‍යාය පත්‍රය කියවීම
04. පසුගිය වාර්ෂික මහාසභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කිරීම
05. වාර්ෂික ප්‍රගති වාර්තාව හා අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම
06. ඉදිරි වර්ෂය සඳහා අනුශාසක මණ්ඩලය, නිළධාරි මණ්ඩලය හා විගණකාධිපතිවරු පත්කිරීම
07. මෙත් සවියේ උන්නතියට උරදුන් කම්ටු සාමාජිකයින් ඇගයීම
08. ස්තුති කතාව
09. ජාතික ගීය වාදනය
10. සමාප්තිය සහ තේපැන් සංග්‍රහය

### මුද්දර ආධාර

මුද්දර ගාස්තු වැඩි වී ඇති බැවින් සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග කිරීමට කැමති පින්වතුන් හට කැමති ප්‍රමාණයක මුද්දර කාර්යාලයට පරිත්‍යාග කරන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

### අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කළ මුදල්

සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කළ මුදල් භාරදීමට කැමති අය කාර්යාලයට එම මුදල් භාර දී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

### මීළඟ මෙත් සවිය සඟරාවේ පළ කිරීම සඳහා සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පළ කරනු ලබන දැන්වීම් භාර ගැනීම

මීළඟ මෙත් සවිය සඟරාවේ එල කිරීම සඳහා ලබාදෙන සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ එල කරනු ලබන දැන්වීම් සභාපතිතුමා වෙත හෝ කාර්යාලයට හෝ භාර දෙන්න.

### මෙත් සවිය හැඳුනුම්පත සහ සාමාජිකත්වය අළුත්කර ගැනීම

මෙත් සවිය හැඳුනුම්පත් මෙතෙක් ලබා නොගත් සාමාජිකයින් එම හැඳුනුම්පත් මෙත් සවිය කාර්යයාලයට පැමිණ ලබා ගන්න. තවද මෙත් සවිය රඳා පවතින්නේ ඔබගේ සාමාජික අරමුදල් මතය. එබැවින් සාමාජිකත්වය අළුත් කර නොගත් අය වෙත්නම් හැකි ඉක්මනින් සාමාජිකත්වය අළුත්කරගෙන අප සංසදයෙන් කෙරෙන සියළුම පුණ්‍යකටයුතු වල කොටස් කරුවකු වන්න.

**මාසයේ පළමු ඉරු දින වැඩසටහන් සිරිත් පරිදි බොරැල්ල ධම්මගවේෂී බෞද්ධාශ්‍රමයේ පැවැත්වීමට විධායක කමිටුව තීරණය කර ඇත.**

මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ

# 21 වන සංවත්සර මහ සභා වාර්තාව

මෙත් සවිය 21 සංවත්සරය - මහසමුළු වාර්තාව
දිනය සහ වේලාව : 2024.05.05 ප.ව. 2.00
ස්ථානය : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
අංක 32, සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 05.

මෙත් සවිය 21 සංවත්සරයේ ප්‍රථම අංගය ලෙස පොල්තෙල් පහන දල්වා මෙත් සවිය තේමා ගීතය ගායනා කරමින් මෙත් සවිය සංවත්සර මහා සමුළුවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. බොරැල්ල ශ්‍රී ලංකාරාමාධිපති පූජ්‍ය වීරගොඩ ඥාණ ස්වාමින් වහන්සේ විසින් මුලසුන හොබවමින්ද ඉන් පසුව ස්වාමීන් වහන්සේ විසින් පැමිණ සිටි පිරිස ආජීව අෂ්ටමක සීලයේ පිහිටවීමෙන්ද සභාවේ ඉදිරි කටයුතු කරගෙන යෑමට යෙදුණි. හොරණ විදුසිල රන්ගයතනයේ දැරියන්ගේ පූජා නර්තනයෙන් උත්සව සභාව ආලෝකමත් විය. මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා විසින් කෙටි දේශනයක් පවත්වා ගරුතර ස්වාමින් වහන්සේලා, උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූ ගරු බුද්ධ ශාසන අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා සහ මෛත්‍රී භූෂණ සම්මානලාභීන් ඇතුළු පැමිණ සිටි පිරිස පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සපැමිණි ගරු බුද්ධ ශාසන අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා ගේ සුරතින් මෛත්‍රී භූෂණ සම්මාන ලබාදෙන ලදී. මෛත්‍රී භූෂණ දාෂ්ටි විශෝධන ශිරෝමණි ගෞරව සම්මානයෙන් මහරගම මහාමේස පෙදෙසේ අංක 110/42 A නිවසේ පදිංචි නෙරංජලා කන්නංගර මැතිනිය, මෛත්‍රී භූෂණ විශ්ව කීර්ති ශ්‍රී අසරණ සරණ ශිරෝමණී ගෞරව සම්මානයෙන් රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පූජ්‍ය පාද රජවැල්ලේ සුභූති හිමිපාණන් වහන්සේ ද පිදුම් ලැබීය.

ඉන් අනතුරුව අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා වෙත සමරු තිළිණයක් ලබාදෙන ලදී. මෙත්සවිය මගින් මහන කල සාමණේර ස්වාමීන්වහන්සේලා විසින් යුගාසන කවිබන සුගායනයක් සිදුකිරීමෙන් උත්සව සභාවට දහම් රස ලබාදෙන ලදී. ඉන් අනතුරුව එළඹියේ මෙත්සවිය මගින් තවත් ප්‍රජා සත්කාර්යයක් ලෙස පවත්වාගෙන යන මෙත්සවිය ළදරු පාසලේ දරු දැරියන්ගේ නර්තන අවස්ථාවයි. මෙත්සවිය සාමාජික මෘදුකාංග ඉන්ජිනේරු සුසන්ත හේරත් මහතා විසින් නොමිලයේ නිර්මාණය කරදුන් ජංගම දුරකථන යෙදුම විවෘත කිරීම මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා සහ සුසන්ත හේරත් මහතා අතින් සිදුවිය. මෛත්‍රී භූෂණ සම්මාන ලාභීන් ගේ කෙටි දේශනා ඉන් අනතුරුව සිදුකිරීමට යෙදුනි. පූරා වසරක කාලයක් මෙත්සවිය මගින් සිදුකල සාසනික සහ සමාජීය සේවාවන් පිළිබඳ ප්‍රගතිය පිලිබඳව සකසන ලද වීඩියෝ ව ඉන් අනතුරුව ප්‍රදර්ශනය කරන ලදී. ඉක්බිතිව හොරණ විදුසිල රන්ගයතනයේ දැරියන්ගේ නර්තනයෙන් උත්සව සභාව ආලෝකමත් විය.

ශ්‍රමය කාලය ධනය කැපකරමින් විශිෂ්ඨ සේවාවන් සිදුකල මෙත් සවිය සාමාජික සාමාජිකාවන් වෙනුවෙන් විශේෂ සම්මාන පිරිනැමීමේ අවස්ථාව සිදුවිය. මේ අනුව නිමේෂ් සශින්ත මහතා, සුසන්ත හේරත් මහතා, කේ. ආර්. පී. දූල්වල මහත්මිය , පුන්‍යා නිශාන්ති මහත්මිය, රංජනී උදුගොඩ මහත්මිය, රුෂාන්ති මහත්මිය සහ නිලූකා ජයසිංහ මහත්මිය මෙත්සවිය විශේෂ සම්මානයන් ගෙන් පිදුම් ලැබීය. ඉන් අනතුරුව මුලසුනේ දේශනය පූජ්‍ය වීරගොඩ ඥාණ ස්වාමින් වහන්සේ විසින් සිදු කරන ලදී. පෙරපාසල් ළමුන්ගේ අලංකාර නර්තනයකින් උත්වස සභාව අලංකාර කිරීමෙන් අනතුරුව පෙරපාසල් දරු දැරියන් සඳහා ත්‍යාග ප්‍රධානය සහ වැඩමකර සිටි මහා සංඝරත්නය විෂයෙහි පිරිකර පූජා කරන ලදී.

ඉන් පසුව මෙත් සවිය මහා මහසමුළු වැඩ කටයුතු ආරම්භ කරන ලදී. පළමුව මෙත් සවිය සම ලේකම් මංජුල රණසිංහ මහතා විසින් න්‍යාය පත්‍රයද, 20 වන සංවත්සර වාර්තාවද ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට චින්තක බණ්ඩාර මහතා යෝජනා කරන ලද අතර එම යෝජනාව චමින්ද ඉන්දික මහතා විසින් ස්ථිර කරන ලදී. 2023-2024 වර්ෂ සඳහා මෙත් සවිය අයවැය සහ ගිණුම් වාර්තා මෙත් සවිය භාණ්ඩාගාරික චින්තක බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට චමින්ද ඉන්දික මහතා යෝජනා කරන ලද අතර එම යෝජනාව වේනුක ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදී.

2024-2025 වර්ෂ සඳහා මෙත්සවිය කමිටු සාමාජික සාමාජිකාවන් පත්කිරීමේ අවස්ථාව එළඹි අතර මෙත් සවිය ව්‍යවස්ථාවට අනුකූලව මෙත් සවිය පැවති කමිටුවේ කමිටු සාමාජිකයින් 1/3 ක පිරිසක් ඉල්ලා අස්වෙන ලදී. මෙත්සවිය ගරු පැවිදි අනුශාසක ලෙස පූජ්‍ය වීරගොඩ ඥාණ ස්වාමින් වහන්සේගේ නම මහාචාර්ය චන්දන ජයරත්න මහතා විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව මංජුල රණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී. මෙත්සවිය ගරු සභාපතිතුමන් ලෙස මහාචාර්ය චන්දන ජයරත්න මහතාව චින්තක බණ්ඩාර මහතා යෝජනා කරන ලදී. එම යෝජනාව මංජුල රණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී. නිමේෂ් සචින්ත සහ කෝසල එදිරිසිංහ යන මහත්වරුන්ගේ නම් උප සභාපතිවරුන් ලෙස පිළිවලින් එස්. ජී. මධුරංග, වේනුක ජයනාත් යන මහත්වරුන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාවන් චමින්ද ඉන්දික, මාලන් කන්දගේ යන මහත්වරුන් විසින් ස්ථිර කරන ලදී. වේනුක ජයනාත් සහ එස්. ජී. මධුරංග යන මහත්වරුන්ගේ නම් සම ලේකම් තනතුර සඳහා පිළිවලින් මංජුල රණසිංහ, චින්තක බණ්ඩාර යන මහත්වරුන් විසින් යෝජනා කරන ලද අතර එම යෝජනා පිළිවලින් චමින්ද ඉන්දික, පියල් චන්ද්‍රතුංග යන මහත්වරුන් විසින් ස්ථිර කරන ලදී. භාණ්ඩාගාරික තනතුර සඳහා චින්තක බණ්ඩාර මහතාගේ නම වේනුක ජයනාත් මහතා විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව මංජුල රණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී. මංජුල රණසිංහ මහතාගේ නම උප භාණ්ඩාගාරික තනතුර සඳහා චමින්ද ඉන්දික මහතා විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව වේනුක ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදී. සංස්කාරක තනතුර සඳහා එම්. කේ. ප්‍රියන්ත මහතාව වේනුක ජයනාත් මහතා විසින් යෝජනා කර චින්තක බණ්ඩාර මහතා විසින් ස්ථිර කරන ලදී.

චමින්ද ඉන්දික, පූර්ණ ප්‍රදීප්, මාලන් කන්දගේ, පණ්ඩුල ගුණසේකර, පියල් චන්ද්‍රතුංග සහ අංජන මෙන්ඩිස් යන මහත්වරුන් කාරක සභික වරුන් ලෙස පත් කරගැනීමට යෝජනා විය. එම සියළු නිලධාරී පත්කිරීම් සහා සම්මත කිරීම සඳහා වේනුක ජයනාත් මහතා යෝජනා කල අතර චින්තක බණ්ඩාර මහතා එම යෝජනාවන් ස්ථිර කරන ලදී.

කාන්තා කමිටුවේ සභාපතිය ලෙස රංජනී උඳුගොඩ මහත්මියද, වෙබ් හා මාධ්‍ය කමිටුවේ සභාපතිත්වය සඳහා සමීර දයාන් මහතාද, දාන-සීල-භාවනා කමිටුවේ සභාපතිත්වය සඳහා නිහාල් මෙන්ඩිස් මහතාද, පර්යේෂණ කමිටුවේ සභාපතිත්වය සඳහා ආචාර්ය පත්මකුමාර ජයසිංහ මහතාද, සුභසාධන කමිටුවේ සභාපතිත්වය සඳහා උපුල් රාජපක්ෂ මහතාද, අසරණ සරණ කමිටුවේ සභාපතිත්වය සඳහා අමල් බණ්ඩාර මහතාද, තරුණ කමිටුවේ සභාපති ලෙස සුරත් චතුරංග මහතගේ නමද, සුව සෙත කමිටුවේ සභාපති ලෙස අතුල නානායක්කාර මහතගේ නමද, මෙත්සවිය TV අනුකමිටුවේ අධ්‍යක්ෂ ධූරය සඳහා චම්පාවෝ ජයකුමාරි මහත්මියද, මෙත්සවිය කළුතර ශාඛාවේ සභාපතිත්වය සඳහා නිහාල් මෙන්ඩිස් මහතාද, යන ලෙස නම් යෝජනා කරන ලදී. එම සියළු නිලධාරී පත්කිරීම් සහා සම්මත කිරීම සඳහා කෝසල එදිරිසිංහ මහතා යෝජනා කල අතර මංජුල රණසිංහ මහතා එම යෝජනාවන් ස්ථිර කරන ලදී.

පී. පී. පෙරේරා සහ වික්‍රම ගුණදාස යන මහත්වරුන් මෙත්සවිය අධීක්ෂණ කමිටු සාමාජිකයකයන් ලෙස පත් කර ගැනීමටත්, අධීක්ෂණ කමිටු සභාපතිත්වය සඳහා පී. පී. පෙරේරා මහතා පත්කිරීම සඳහාත් චමින්ද ඉන්දික මහතා යෝජනා කරන ලද අතර එම යෝජනාව වේනුක ජයනාත් මහතා ස්ථිර කරන ලදී. සමාගම් ලේකම් ලෙස මනම්පේරි මුදියන්සේලාගේ විජිත මනම්පේරි මහතා මංජුල රණසිංහ මහතා විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව චින්තක බණ්ඩාර මහතා විසින් ස්ථිර කරන ලදී. මෙත්සවිය සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා විසින් ස්තුති ප්‍රකාශ කිරීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කර උත්සවයේ වැඩ කටයුතු නිමාවට පත් කරන ලදී.

**මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ සභාපති ගරු චන්දන ජයරත්න ගුරුතුමාගේ ආශිර්වාද, මගපෙන්වීම අනුව යමින් මෙත්සවිය මෛත්‍රී සංසදයේ 21 වන සංවත්සර සැමරුම් උළෙල උතුම් ආර්ය මහා සංඝරත්නයේ ආශිර්වාද මධ්‍යයේ තුම්මුල්ල සම්බුද්ධත්ව ජයන්ති මන්දිර ශාලාවේ දී 2024/05/05 වන ඉරුදින ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවති අතර ඒ සත්කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ආධාර උපකාර කල පිංවතුන්.**

යුගාසන කවිබණ දේශනාව, මහාචාර්‍ය චන්දන ජයරත්න ගුරුතුමන්ගේ උතුම් සංකල්පයක් පරිදි, සම්බුද්ධ ශාසනයේ පැවැත්ම, උන්නතිය තහවුරු කරනු සඳහා සසුන්කෙතෙහි පැවිදි කර දායාද කල විහාරමහාදේවි පිරිවෙන්හි අධ්‍යාපනය හදාරන පූජ්‍ය කඹුරුගමුවේ ගෝතම හිමි සහ ලෙල්ලොපිටියේ සුපේෂල සාමණේරහිමියන් විසින් සිදුකරන ලද අතර ඒ සඳහා බැතිබර දායකත්වය

- චතුරිකා කුමාරගේ මෙනවිය
- සුනිල් කුමාරගේ මහතා

■ ශාලාව අලංකාර කිරීම සඳහා මල් සැරසිලි දායකත්වය-
- ශාලිනි දිණුකා මෙනවිය

■ පැමිණ සිටි සියළු පිරිස සඳහා සංග්‍රහ දායකත්වය -
- විපුලතේජ විශ්වනාත් අපොන්සු මහතා
- වික්‍රම ගුණදාස මහතා
- මාලා සේරසිංහ මහත්මිය
- කාන්තා කමිටුව විසින්

■ 21 වන මහ සමුළුව පැවැත්වීම සඳහා ශාලා ගාස්තු දායකත්වය -
- ශිරන්ත ඉලංගරත්න මහතා

■ පැමිණි පිරිස සඳහා සිසිල් පැන් දායකත්වය -
- අමිල නාගසිංහ මහතා

■ අටපිරිකර සඳහා දායකත්වය
- මහාචාර්ය චන්දන ජයරත්න ගුරුපියාණන්
- වසන්ත වීරසේකර මහතා
- ලිලාන් ධම්මිකා මෙනවිය
- චතුරිකා කුමාරගේ මෙනවිය
- ජී. විජේතුංග මහත්මිය
- පියසීලි පෙරේරා මහත්මිය
- අමිල නාගසිංහ මහතා
- නිමේෂ් සශින්ත මහතා
- නදීකා දිසානායක මෙනවිය
- පබා ද සිල්වා මෙනවිය
- ආර්. එම්. එච්. ඩිලානි මෙනවිය

■ මුදල් පිරිකර සඳහා දායකත්වය
- මහාචාර්‍ය චන්දන ජයරත්න ගුරුපියාණන්
- ටිල්ඩා පෙරේරා මහත්මිය
- හේමන්ති පෙරේරා මහත්මිය
- චතුරිකා කුමාරගේ මෙනවිය
- නාමලී ගුණරත්න මහත්මිය
- ස්වර්ණා ගුණසේකර මහත්මිය
- එම්. එන්. එස්. සිල්වා මහත්මිය
- ලක්ෂ්මන් රණවීර මහතා
- එච්. එම්. විමලාවතී මිය
- ඉරේෂා එරංග මහතා
- දුර්ගා චාන්දනී සල්ගාදු මෙනවිය

■ ස්වාමීන් වහන්සේලා සඳහා සිවුරු පිරිකර දායකත්වය -
- මහාචාර්ය චන්දන ජයරත්න ගුරුතුමා

■ කොට්ට පිරිකර සඳහා දායකත්වය
- සෝමා දීගල්ල මහත්මිය
- හේමන්ති පෙරේරා මහත්මිය
- එරංදිකා/තාරුකා/රූපා මහත්මිය
- සීතා මාලනී මහත්මිය
- ශෂී ප්‍රභා/කපිල කුෂාන්ත මහතා
- ඉන්ද්‍රානි සෙනවිරත්න මිය
- දේවිකා කරුණාසේන මෙනවිය
- ප්‍රියංකා තුෂාරි මිය
- තමරා සමරවීර මිය
- ඊ. ඩබ්. කරුණාදාස මහතා
- එම්. ඩබ්. ටී. සේරසිංහ මිය
- ලලන්ති ද සොයිසා මිය
- ශලනි සුරවීර මිය
- ඩිනෙල්කා තිකොළි ගමගේ මෙනවිය
- උපුල් පතිරණ මහතා
- චන්ද්‍ර කාන්ති දහනායක මයා
- පණ්ඩුල ගුණසේකර මහතා
- අජිත් ගමගේ මහතා
- සදමාලි පීරිස් මිය
- චතුරිකා කුමාරගේ මෙනවිය

■ ස්වාමීන් වහන්සේලා සඳහා වියළි ආහාර ද්‍රව්‍ය පූජාව දායකත්වය -
- අසරණ සරණ කමිටුව

■ මෙත් සවිය පෙරපාසැලේ දරුවන් සඳහා තෑගි ඇතුළු ද්‍රව්‍යය සඳහා දායකත්වය

- පාසැල් බෑග් සඳහා දායකත්වය -
  එම්.පී.කේ.පී.එන්. ශාන්ත මහතා
- නිල ඇඳුම් සඳහා දායකත්වය -
  ලක්ෂිකා චතුරාණි මහත්මිය
- වතුර බෝතල් හා කෑම පෙට්ටි සඳහා දායකත්වය -
  ඩබ්.එම්.පී. විජේරත්න මහතා
- තෑගි භාණ්ඩ (සෙල්ලම් බඩු) සඳහා දායකත්වය -
  උපේකා රොද්‍රිගෝ මිය
- තෑගි භාණ්ඩ (පොත්) සඳහා දායකත්වය -
  නිලූකා ජයසිංහ මිය
- පාවහන් සඳහා දායකත්වය -
  චින්තක බණ්ඩාර මහතා
  හේමන්ති පෙරේරා මහත්මිය
  රංජනී උඳුගොඩ මහත්මිය
  තලතා ද සොයිසා මහත්මිය

■ පෙර පාසල් දරුවන් සඳහා සහ පොඩි හාමුදුරුවන් සඳහා රසකැවිලි දායකත්වය -

චතුර රාජ් මුණසිංහ මහතා
ප්‍රියානි මුණසිංහ මහත්මිය
තුෂාරා ප්‍රිම්රෝස් මහත්මිය
සංජය සේනාධීර මහතා
දයානි වික්‍රමසිංහ මිය

■ සාමාජිකයින් සඳහා මෙත්සවිය සමරු ලාංඡනය සඳහා දායකත්වය -

එම්. කේ. ප්‍රියන්ත මහතා
චින්තක බණ්ඩාර මහතා
මංජුල පත්මකුමාර මහතා




# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## 2025 මැයි මස 04 වන ඉරු දින මෙත්සවිය 22 වන සංවත්සර සැමරුම සහ මෛත්‍රීභූෂණ උපහාර උළෙලේ න්‍යාය පත්‍රය

**ප.ව.**

01 . 15 සාමාජිකයින්ගේ සහ ආරාධිත අමුත්තන්ගේ පැමිණීම, තේ පැන් සංග්‍රහය සහ ඇතුල්වනවිට දෙනුලබන සමරුම් ප්‍රදානය

01 . 30 ධර්මදේශනාව - බොරැල්ල ශ්‍රී ලංකාරාමාධිපති **අතිපූජ්‍ය වීරගොඩ ඥාණ ස්වාමීන්ද්‍රයන් වහන්සේ**

02 .30 ගරුතර මහා සංඝරත්නය වැඩම කරවීම සහ 22 වන සංවත්සර සැමරුමේ ප්‍රධාන ආරාධිත අමුත්තා ඇතුළු මෛත්‍රී භූෂණ සම්මාන ලාභීන්ගේ පෙරහර

02 . 40 සාම්ප්‍රදායික පොල්තෙල් පහන දැල්වීම

02 . 45 මුලසුන හෙබවීම: තිස්සමහාරාම රාජමහා විහාරාධිපති මාතර කන්දබොඩ පත්තුව ඇතුළු හම්බන්තර පළාතේ ප්‍රධාන සංඝනායක, **ආචාර්ය දේවාලේගම ධම්මසේන ස්වාමීන්වහන්සේ**

02 . 50 මල් පහන් පුදා ආජීව අෂ්ඨමක සීලය සමාදන් වීම මෙත් සවිය තේමා පාඨය කියවීම

02 . 55 පිළිගැනීමේ නර්තනය (බෙර වාදනය)- හොරණ විදුසිළු රංගායතනය

03 . 00 පිළිගැනීමේ කථාව - මෙත් සවිය ගරු සභාපති, විද්‍යාකීර්ති මහාචාර්ය **චන්දන ජයරත්න මහතා**

03 . 05 මෙත් සවිය විසින් මහණ කරවන ලද සාමණේරයන් වහන්සේලා දෙනමකගේ යුගාසන කවිබණ ධර්ම දේශනාව

03 . 20 භක්තිගීතය - මෙත්සවිය කළුතර පෙර පාසල් දරුවන්

**මෛත්‍රී භූෂණ සම්මාන පිරිනැමීම**

03 . 30 බොරැල්ල, ලෙස්ලි රණගල මාවත, ශ්‍රී ලංකාරාම විහාරස්ථානයේ වැඩවෙසෙමින්, වසර 20 ක් පිරිවෙන් අධ්‍යාපනය ලබා දෙමින්, ඉතා දුෂ්කර සමාජ වාතාවරණයක් සහිත ප්‍රදේශයක නොසැලී උතුම් බුද්ධ පුත්‍රයකු ලෙස නොබියව ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය සාමාජීය ආගමික කටයුතු සිදු කර දෙමින්, වැඩිහිටි නිවාස පවත්වාගෙන යමින්, රිජ්වේ ආර්යා ළමා රෝහලේ ආගමික කටයුතු නොපිරිහෙලා ඉටු කරමින්, මෙත්සවිය පැවිදි අනුශාසක ධූරය දරමින්, අනුපමේය සමාජීය ආගමික මෙහෙවරක යෙදෙන **පූජ්‍ය විශ්‍රාමික පරිවේණාචාර්ය වීරගොඩ ඥාණ හිමිපාණෝ** වෙත මෛත්‍රී භූෂණ සම්මානය පිරිනැමීම

03 . 40 ශ්‍රී ලංකා පොලිස් සේවයේ වසර 40 කට අධික කාලයක් විවිධ වූ රාජකාරි නිසි පරිදි අවංකව ඉටු කරමින්, බුද්ධ ශාසනය, උතුම් ධර්ම රත්නය සහ සංඝ රත්න විෂයේ දාන මාන ආදි පුණ්‍ය කටයුතු නොකඩවා සිදු කරමින්, පරම්පරාවෙන් ලැබුණු ඉඩකඩම් බුද්ධ ශාසනය උදෙසා පරිත්‍යාග කරමින්, බුදු පිළිම තැනීම , පූජා භූමි ප්‍රතිසංස්කරණය කිරීමට උර දෙමින්, උතුම් ජාත්‍යාලයෙන් සහ ශාසනාලයෙන් අනුපමේය මෙහෙවරක යෙදෙන **විශ්‍රාමික ප්‍රධාන පොලිස් පරීක්ෂක අගම්පොඩි නිහාල් ප්‍රේමවංශ මැන්දිස් මහතා** වෙත මෛත්‍රී භූෂණ සම්මානය පිරිනැමීම

03 . 50 මෛත්‍රී භූෂණ උපහාරලාභීන් විසින් පවත්වනු ලබන කෙටි දෙසුම්

04. 00 මෙත් සවිය විසි දෙවසරක ප්‍රගති සමාලෝචනය

04 . 10 ආර්යමහා පිරිවෙන් ස්වාමීන්වහන්සේලාට පරිෂ්කාර පූජාව හා මෙත් කැකුළු දරුවන් වෙනුවෙන් පරිත්‍යාග

04. 20 ප්‍රාසාංගික වැඩසටහන - මෙත් සවිය කළුතර පෙර පාසලේ දරුවන්

04 . 25 මුලසුනේ දෙසුම

04 . 35 ප්‍රාසාංගික වැඩසටහන - මෙත් සවිය කළුතර පෙර පාසලේ දරුවන් සඳහා පරිත්‍යාග

04 . 40 **වාර්ෂික මහා සමුළුව** : පසුගිය වාර්ෂික මහ සමුළුවේ වාර්තාව ඉදිරිපත් කිරීම, වාර්ෂික ප්‍රගති වාර්තාව හා අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම, ඉදිරි වර්ෂය සඳහා නිළධාරී මණ්ඩලය සහ විගණකවරු පත් කිරීම

04 . 55 ස්තුති කතාව - සම ලේකම්

05 . 00 ජාතික ගීය වාදනය කිරීම

සමාප්තිය

**(මෙම උත්සවය සඳහා සුදු හෝ ලා පැහැති ඇඳුමකින් සැරසී පැමිණීම වඩා යෝග්‍ය වේ).**

# තිස්සමහාරාම රාජ මහා විහාරය



තිස්සමහාරාම රාජ මහා විහාරය ශ්‍රී ලංකාවේ දකුණු පළාත තුල තිස්සමහාරාමයේ පිහිටා තිබේ. විහාරය ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේදී රුහුණේ කාවන්තිස්ස රජු විසින් ඉදිකරවන ලද්දකි. මෙම තිස්සමහාරාම පුදබිම, බුදුන් වහන්සේගේ පාදස්පර්ශය ලත් පුදබිමක් ලෙස සැළකෙයි. තිස්සමහාරාම රජ මහා විහාර පරිශ්‍රයේ ඉදිකොට ඇති තිස්සමහාරාම දාගැබ, ශ්‍රී ලංකාවේ නිර්මාණය කොට ඇති විශාලතම දාගැබ් අතුරින් එකක් වෙයි. එය බුබ්බුලාකාර හැඩයෙන් නිමවා ඇත.

## ඉතිහාසය

ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යයාගේ පාලන සමයේදී (ක්‍රි.පූ. 304-232), බෞද්ධ දර්ශනය ප්‍රචාරය කිරීම සඳහා බොහෝ ප්‍රමුඛ බෞද්ධ භික්ෂූන් වහන්සේලා අසල්වැසි රාජධානිවලට මිෂනාරිවරුන් ලෙස යවන ලදී. මෙම දූත මෙහෙවරේ කොටසක් ලෙස, අශෝක අධිරාජ්‍යයාගේ පුත් මිහිඳු මහරහතන් වහන්සේ ක්‍රි.පූ. 3 වැනි සියවසේ අනුරාධපුර දේවානම්පියතිස්ස රජුගේ පාලන සමයේදී ශ්‍රී ලංකාවට වැඩම කළහ. ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනය පිහිටුවීමෙන් පසු අනුරාධපුර මහා විහාරය, මිහින්තලේ රජමහා විහාරය වැනි ප්‍රධාන බෞද්ධ ආරාම රටේ උතුරු මැද ප්‍රදේශයේත්, තිස්සමහාරාම රජමහා විහාරය සහ සිතුල්පව්ව රජමහා විහාරය දකුණු ප්‍රදේශයේත් පිහිටුවන ලදී.

මහාවංශය වංශකථාවට අනුව මෙම විහාරය ක්‍රි.පූ 2 වැනි සියවසේ දී සිලපස්ස පිරිවෙන ලෙසත්, එවකට රුහුණේ (දකුණු ශ්‍රී ලංකාවේ) කාවන් තිස්ස රජු (ක්‍රි.පූ. 186-161) සහ ඉලනාග රජුගේ (ක්‍රි.ව. 38-44) රාජ්‍ය සමයේදීත් ඉදිකරන ලද්දකි. විහාරස්ථානය පුළුල් කර ප්‍රතිසංස්කරණය කර ඇත. නමුත් සමහර ඉතිහාසඥයින්ට අනුව මෙම විහාරය මුලින් ක්‍රි.පූ 3 වන සියවසේ මහානාග රජු විසින් ඉදිකරන ලද අතර පසුව එය ක්‍රි.පූ 2 වන සියවසේදී කාවන් තිස්ස රජු විසින් ප්‍රධාන විහාරස්ථානයක් ලෙස පුළුල් කරන ලදී.

රුහුණු රාජධානියේ ආරම්භය ක්‍රිස්තු පූර්ව 2 වැනි සියවසේ දේවානම්පියතිස්ස රජ සමය දක්වා දිව යයි. ඔහුගේ බාල සොහොයුරා වන මහානාග සාතන උත්සාහයක් වැලැක්වීම සඳහා එවකට අගනුවර වූ අනුරාධපුරය අතහැර දිවයිනේ දකුණු ප්‍රදේශයට ගොස් ප්‍රදේශයේ පාලකයා බවට පත්විය. මාගම අගනුවර වූ රුහුණේ පළමු රජු ලෙස මහානාග සැලකේ. මහානාග රජු කෘෂිකර්මාන්තය වැඩිදියුණු කිරීමට විශාල සේවයක් කළ අතර ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ සාමකාමී සහ සමෘද්ධිමත් ශිෂ්ටාචාරයක් ඇති කිරීමට වගකිව යුතු විය. ඔහුගෙන් පසු ඔහුගේ පුත්‍රයා වූ යටාල-තිස්ස, ධාර්මිකව පළාත පාලනය කිරීමට සමත් විය. යටාල තිස්සගෙන් පසු ඔහුගේ පුත් ගෝඨාභය දකුණේ රජ වූ අතර මේ වන විට රුහුණු රාජධානිය හොඳින් ස්ථාපිත වී දියුණු විය. ගෝඨාභයගෙන් පසු ඔහුගේ පුත් කාවන්-තිස්ස සිහසුනට පත් විය. කාවන් තිස්ස රජු ශ්‍රී ලංකාවේ දකුණු හා නැගෙනහිර ප්‍රදේශවල පිහිටි බොහෝ බෞද්ධ ආරාමවල නිර්මාතෘවරයා ලෙස සැලකේ.


තිස්මහාරාම විහාරය ඓතිහාසික දකුණු ශ්‍රී ලංකාවේ විශාලතම බෞද්ධ ආරාමය විය. මෙම මහා ආරාමයේ කැපී පෙනෙන නේවාසික බෞද්ධ භික්ෂූන් වහන්සේලා අතරට මහාසිව මහරහතන් වහන්සේ, ධම්මදින්න මහරහතන් වහන්සේ සහ අරහත් පිණ්ඩපාතික තිස්ස හිමියන් ඇතුළත් වේ. තිස්මහාරාම විහාරය ආරම්භ කළ කාවන් තිස්ස රජු තිස්සමහාරාම ආශ්‍රමයේ ජල අවශ්‍යතාවය මෙන්ම අවට ප්‍රදේශයේ වාරි අවශ්‍යතා සපුරාලීම සඳහා තිසා වැව (වැව) ද නවීකරණය කළේය. ශ්‍රී ලංකාවේ බොහෝ පැරණි රජවරු ද තිස්සමහාරාම ආශ්‍රමයේ වැඩසිටි බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සුබසාධනය සඳහා එම ආරාමයට ඉඩම් පූජා කර ඇත. තිස්සමහාරාම විහාරයට බොහෝ ඉඩම් පරිත්‍යාග කර ඇත්තේ ජෙත්ත තිස්ස, වසභ සහ මිහිඳු යන රජවරුන්ගේ පාලන සමයේදී බව සොයාගෙන ඇති පැරණි ශිලා ලිපිවල සඳහන් වේ. 3 වන සියවසේ සිට 5 වන සියවස දක්වා ආරාමයට අක්කර 18 000 කට වඩා වැඩි ඉඩම් ප්‍රමාණයක් හිමි විය. මෙම ඉඩම් පරිත්‍යාග කරන ලද්දේ රජවරුන් විසින් සංඝාවාසයේ සහ ස්තූපයේ නඩත්තු කටයුතු සඳහා මෙන්ම නේවාසික භික්ෂූන් වහන්සේලාගේ අවශ්‍යතා සඳහා ය.

තිස්සමහාරාම විහාරය ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රථම සාක්ෂිය ක්‍රිස්තු වර්ෂ 38 දී ඉලනාග රජුගේ පාලන සමය දක්වා එහි මූලික ඉදිකිරීම් වලින් සියවස් දෙකකට පසුව ය. 3 වැනි සියවසේ වෝහාරක තිස්ස රජු (ක්‍රි.ව. 215-237) ද ස්තූපයේ යම් ප්‍රතිසංස්කරණයක් කර ඇත. 6 වැනි සියවසේදී ස්තූපයේ තත්ත්වය නැවත වරක් පිරිහුණු විට මහානාග කුමරු ක්‍රිස්තු වර්ෂ 560 දී ස්තූපය ප්‍රතිසංස්කරණය කළේය. පළමුවන විජයබාහු රජුගේ පාලන සමයේදී (ක්‍රි.ව. 1055-1110) එය ප්‍රතිසංස්කරණය කර ඇත. නමුත් පසුව තිස්සමහාරාම විහාරය 13 වන සියවසේදී ආක්‍රමණික කාලිංග මාඝගේ හමුදාවන් විසින් වටලනු ලැබීය. ඉන් පසු 19 වැනි සියවසේ අවසාන භාගය වනතුරුම මෙම ස්තූපයේ කිසිදු ප්‍රධාන ප්‍රතිසංස්කරණ කටයුත්තක් සිදු නොවූ බව පෙනේ. කෙසේ වෙතත් ක්‍රිස්තු වර්ෂ 1662 දී කඳුරුපොකුණේ බුද්ධ රක්ඛිත හිමියන් විහාරාධිපතිව සිටියදී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසින් නඩත්තු කටයුතු සඳහා විහාරස්ථානයට ඉඩම් දෙකක් පරිත්‍යාග කර ඇති බව මූලාශ්‍ර අනාවරණය කරයි.නමුත් පසුව 18 වන සියවසේදී ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල ලන්දේසි යටත් විජිත පාලන සමයේදී විහාරස්ථානයේ තත්ත්වය දැඩි ලෙස පිරිහීම නිසා තිස්මහාරාම විහාරය අත්හැර දමන ලදී.

## මහා ස්තූපය

තිස්සමහාරාම ස්තූපය අඩි 156 ක උසකින් සහ අඩි 550 ක වට ප්‍රමාණයකින් යුත් රටේ දකුණු ප්‍රදේශයේ විශාලතම ස්ථූපය වේ. වංශකතාවලට අනුව, කාවන් තිස්ස රජු තිස්සමහාරාම ස්ථූපය ඉදි කිරීමේදී රජුගේ අධ්‍යාත්මික උපදේශකයෙකු වූ ගෝතම රහතන් වහන්සේගෙන් ආශීර්වාද සහ උපදෙස් ලබාගෙන ඇත. බුදුන් වහන්සේ 500 නමක් සමඟ භාවනායෝගීව කාලය ගත කළ ස්ථානයේම, බුදුන් වහන්සේ එම ප්‍රදේශයට වැඩම කිරීම සිහිපත් කිරීම සඳහා මෙම ස්තූපය ඉදිකරන ලදී.

ග්‍රැනයිට් ගල්වලින් තැනූ හතරැස් වේදිකාවක් මත ගඩොල් යොදා ඉදිකරන ලද බුබුලු හැඩයක් ඇති ස්තූපය. කාවන්තිස්ස රජුට ස්තූපයේ ඉදිකිරීම් කාලය පුරාවටම බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ උපදෙස් ලැබුණි. මෙම ස්තූපයේ තැන්පත් කර ඇති ධාතූන් වහන්සේලා විවාදයට භාජනය වේ. මහාවංශයට අනුව ප්‍රධාන ධාතුව ලෙස තිස්සමහාරම් ස්ථූපයේ ඉදිරිපස අස්ථි ධාතුව (ලලාට ධාතු) තැන්පත් කර ඇත. කෙසේ වෙතත් ඇතැමුන් විශ්වාස කරන්නේ බුදුරදුන්ගේ ඉදිරිපස අස්ථි ධාතුව තාවකාලිකව මෙම ස්තූපයේ තැන්පත් කර ඇති නමුත් පසුව එය සේරුවිල මංගල මහා චෛතියෙහි තැන්පත් කර ඇති බවයි.මෑතදී කිරින්ද ප්‍රදේශයේ ස්ථම්භ ලිපියක් සොයාගැනීමෙන් හෙළිවන්නේ බුදුන්ගේ වම් දළදා වහන්සේ ද මෙම ස්තූපයේ තැන්පත් කර ඇති බවයි.



එම ප්‍රදේශයේ වෙල්යාය හරහා තිස්සමහාරාම සෑය දර්ශනය

**මූලික තොරතුරු**

**භූගෝලීය පිහිටීම**
**ඛණ්ඩාංක** 6°16'46"N 81°17'25"E
**පිහිටි දිස්ත්‍රික්කය** - **හම්බන්තොට**
**පළාත** - **දකුණු පළාත**

**ගෘහ නිර්මාණ විස්තර**

**ආදිකර්තෘ** - **රුහුණේ කාවන්තිස්ස රජතුමා**
**වැඩ නිමවූයේ** - **2 වන සියවසේ පමණ**

## ප්‍රතිසංස්කරණ

මෙම ප්‍රදේශය වන්දනා කර තිස්මහාරාම විහාරය නැවත සොයා ගත් වැපතයිර සුමන හිමියන්ගේ උත්සාහය හේතුවෙන් 1858 දී මෙම චෛත්‍යයේ වඩාත් මෑතකාලීන ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ විය. ඔහු ස්තූපය ආසන්නයේ මඩුවක් තනා එහි ප්‍රතිසංස්කරණ කටයුතු තමා විසින්ම අධීක්ෂණය කිරීම සඳහා එහි වාසය කිරීමට පටන් ගත්තේය. උස අඩි 86ක් වන ස්තූපයේ අර්ධ ගෝලාකාර කොටස වන ගාර්භය ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීමට වසර 16ක් ගත විය. නමුත් වැපතයිර සුමන හිමියන්ට තම ජීවිත කාලය තුළ තිස්මහාරාම චෛත්‍ය ප්‍රතිසංස්කරණය කර අවසන් කිරීමට නොහැකි වූ අතර වැපතයිර සුමන හිමියන්ගේ අපවත්වීමෙන් පසු වැපතයිර සුමන හිමියන්ගේ පැවිදි සොහොයුරෙකු වූ වල්පිට මේධංකර හිමියන් ප්‍රතිසංස්කරණ කටයුතු භාර ගත්තේය. 1878 වන විට වල්පිට මේධංකර හිමියන් විසින් හතරස්කොටුව ස්තූපයේ ප්‍රතිසංස්කරණය කර එහි ධාතු නිදන් කර අවසන් කිරීමට සමත් විය.

1882 දී ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වූ ශ්‍රීමත් ජේම්ස් රොබට් ලෝන්ග්ඩන් තිස්සමහාරාම විහාරයට වැඩම කර වල්පිට මේධංකර හිමියන් එම විහාරස්ථානයේ විහාරාධිපති ලෙස පත් කළේය. තිස්සමහාරාම රජමහා විහාරය භාර ගැනීමේ බලය ද සියම් නිකායට පැවරුවේය.

1895 දී වල්පිට මේධංකර හිමියන් විසින් දේවතා කොටුවේ වැඩ අවසන් කර ධාතු නිදන් කිරීමට සමත් විය.

1897 දී මාතර මුදලියාර් එස්. එෆ්. ජයවික්‍රම සහ තංගල්ලේ එන්. අමරසිංහ යන අයගේ ප්‍රධානත්වයෙන් තිස්සමහාරාම රජමහා විහාර සංවර්ධන කමිටුව පිහිටුවා 20 වැනි සියවසේ මුල් භාගයේදී ප්‍රතිසංස්කරණ කටයුතු නිම කරන ලදී. 1900 දී කොත් කැරැල්ල, සැයේ නිමවා ස්ථූපයේ කොත (චූඩා මාණික්‍යය) තැන්පත් කිරීම 1900 පොසොන් පොහෝ දින සිදු කරන ලදී. මෙම කොත බොහීමියාවෙන් ආනයනය කරන ලද රතු පැහැති මැණිකකින් සමන්විත වේ.

තිස්සමහාරාම ස්ථූපය 1990 වර්ෂයේදී චෛත්‍ය ගෝලාකාර වටේට දකුණින් සහ තවත් ප්‍රදේශ කිහිපයක සිරස් ඉරිතැලීම් මාලාවක් නිර්මාණය කර ඇත. විහාරාධිපති හිමියන්ගේ ඉල්ලීම මත ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ඉංජිනේරු සහයෝගිතාව මැදිහත් වී එය වළක්වා ඇත. මැද කොටසේ ගෝලාකාර වට ප්‍රමාණය වටා බැඳ ඇති ගැල්වනයිස් කරන ලද වානේ කේබල් භාවිතයෙන් ස්තූපය තවදුරටත් ඉරිතලා යාමවළක්වා ඇත. මෙම අවසන් අලුත්වැඩියා කටයුතු 1998 පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකා රුපියල් මිලියන 6 ක වියදමින් නිම කරන ලදී

## ස්වාමීන් වහන්සේලාගේ පා දෝවනයේ ආනිශංස



ස්වාමීන් වහන්සේලාගේ පා දෝවනය බෞද්ධ සම්ප්‍රදායේ ගෞරවනීය හා පින් පිරුණු ක්‍රියාවකි. මෙහි ආනිසංස කිහිපයක් පහත දැක්වේ

**ගෞරවය ප්‍රකාශ කිරීම:**
පා දෝවනය මගින් ස්වාමීන් වහන්සේලා කෙරෙහි ගෞරවය හා භක්තිය ප්‍රකාශ කෙරේ. ධම්මපදයේ මෙසේ සඳහන් වේ.

**අභිවාදනසීලිස්ස, නිච්චං වඩ්ඩාපචායිනො**
**චත්තාරො ධම්මා වඩ්ඪන්ති, ආයු වණ්ණො සුඛං බලං.**
නිතර වැඩිහිටියන්ට ගරු කරන්නාට, වැඩිමහල්ලන් පුදන්නාට
සතර දෙයක් වැඩේ. ආයුෂය, වර්ණය, සැපය හා බලයයි.

**කර්ම විපාක:**
බුද්ධ ධර්මයට අනුව, යහපත් ක්‍රියා යහපත් ප්‍රතිඵල ගෙන දෙයි.
අංගුත්තර නිකායේ මෙසේ සඳහන් වේ:
යාදිසං වපතෙ බීජං, තාදිසං හරතෙ ඵලං - යම් බීජයක් වපුරන්නේද, එබඳු ඵලයක් ලබන්නේය.

**නිවන් මග පෑදීම:**
ස්වාමීන් වහන්සේලාට සේවය කිරීම නිවන් මගට උපකාරී වේ. දීඝ නිකායේ සිගාලොවාද සූත්‍රයේ (31) බුදුරජාණන් වහන්සේ ශ්‍රමණයන්ට සේවය කිරීමේ වැදගත්කම දේශනා කරන සේක.

**මානසික සුවය:**
පා දෝවනය වැනි ගෞරවනීය ක්‍රියා මානසික සුවය හා සතුට වර්ධනය කරයි. මජ්ඣිම නිකායේ වත්ථූපම සූත්‍රයේ (7) පිරිසිදු සිතක ආනිසංස විස්තර කෙරේ.

**පින් රැස් කිරීම:**
බෞද්ධ ඉගැන්වීම් අනුව, මෙවැනි ක්‍රියා මගින් පින් රැස් වේ. අංගුත්තර නිකායේ මෙසේ සඳහන් වේ:
පුඤ්ඤානි පරලොකස්මිං, පතිට්ඨා හොන්ති පාණිනං. - පින් යනු පරලොව දී සත්ත්වයන්ට පිහිට වන්නේය.

**ආදර්ශයක් සැපයීම:**
මෙවැනි ක්‍රියා අන් අයට ආදර්ශයක් සපයයි, එමගින් සමාජයේ සදාචාරය හා ආධ්‍යාත්මික වටිනාකම් වර්ධනය වේ.

**සංඝයා සමග සම්බන්ධතාව:**
පා දෝවනය මගින් සංඝයා සමග සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගත හැකිය, එමගින් ධර්මය ඉගෙනීමට හා පුහුණු වීමට වැඩි අවස්ථා ලැබේ. මෙම ආනිසංස සියල්ල බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම් මත පදනම් වේ. කෙසේ වෙතත් වැදගත්ම කරුණ වන්නේ මෙවැනි ක්‍රියා පිරිසිදු හා අවංක සිතකින් සිදු කිරීමයි.

උපුටා ගැනීමකි

# ගෙඩිය ගැසීම සහ එහි ආනිසංස ධර්මතා

**ගෙඩිය ගැසූ කළ.**
**සතං හත්ථී, සතං අස්සා... යනාදීන් සිහිකරමින්**
**දාගැබ් මහබෝයට එළඹ පිදිය හැකි වතක් ඇත පුදා..**
**යනාදී ලෙස දක්වන ගෙඩිය ගැසීම...**

මෙහිදී ගොඩක් පහල මාත්‍රාවේ සිට ඉහළ මාත්‍රාව දක්වා නාදය ගෙනවිත් නැවත අඩු ශබ්ද නාදයේ සිට ඉහලට යෑම සිදු කොට මෙසේ තෙවරක් ම එය සිදු කොට අවසානයේ තුන්වර ගෙඩිය ගැසීමටත්. ඒ පිණිස ලී ගෙඩියක් යොදාගැනීමටත් විශේෂ හේතු ඇත.

මෙහිදී ඒ සඳහා විශේෂ හේතුවක් ලෙස ගත යුත්තක් නම්.. භාවනා යෝගී ස්වාමීන් වහන්සේලාට පිණ්ඩපාතය වැඩීමට උපෝෂථ විනය කර්මයකට හෝ යම්කිසි සාසනික කටයුත්තකට වෙලාව හඟවන විට එය එකවර මහා සද්දයක් සාන්ධාවක් හඬ නැගීමෙන් ව උන්වහන්සේලාගේ භාවනාව බිඳී සමහරවිට මාර්ගඵල සිතකට පත් වෙන්නට තිබූ අවස්ථාවක් ද නැති විය හැක...

එබැවින් කුඩා ශබ්ද ඒ සිට හිමින් හිමින් දැනෙන තරමේ ශබ්දයකට එන විට ඒ භාවනා සිතට පළිබෝධයක් නොවී හිමින් හිමින් ශබ්දය අරමුණට පැමිණේ.
දෙවන තෙවන වතාවටත් හඬ නංවන විට ඊටත් වඩා ගැඹුරු මනසිකාරය ක සිටින හිමිවරුන්ට ද එය ඇසේ.
අවසානයේ තෙවරක් ශබ්ද නාද පැවැත්වීම තුළ හරියටම එය ගෙඩි සබ්දය බව ඒ සංඝුන් සිතට තහවුරු වේ...
විශේෂයෙන්ම කුරුල්ලෙක් ගහකට කොටනවා වන් ස්වභාවික ශබ්දයක් නිසා එය සිතට සිසිලසක් සැනසීමක් ගෙනදේ, බාධාවක් නොවේ.

වන ගැබ මැද්දෙන්.. ගෙඩි හඬ මතුවී එන ආකාරය හරිම සාසන මිහිරියාවකි.

මේ ගෙඩි පූජාවෙහි ආනිසංස මහත්ය..

මහා සංඝරත්නය පිණ්ඩපාත වැඩීම, මහා සංඝරත්නය එක් රැස් කර කැඳවීම, වත් පිළිවෙත් කිරීම ඇතුළු කාල වේලාව හැදින්වීම සඳහා ආරණ්‍ය සේනාසන වල භාවිතා කෙරෙන නාද කර ශබ්දය මුදා හැර කාල හැඟවීම සඳහා අවශ්‍ය උපකරණක් වන "ගෙඩිය" නිර්මාණය කිරීම.

**ගෙඩිය ගැසූ කළ**

**"සතං හත්ථී සතං හත්ථී අස්සා"** යනාදීන් සිහිකරමින් දාගැබ් මහා බෝයට එළඹ තිබිය හැකි වතක් ඇත පුදා. යනාදී ලෙස පුරාතනයෙහි පටන් ම, මේ විශ්වයේ දී බුදු පසේබුදු උතුමන්ට පසුව වඩාත්ම ශ්‍රේෂ්ඨ උත්තම උත්තමයෝ වැඩ හිත පිණිස වන භික්ෂූන් වහන්සේලාගේ උතුම් පිම්බර අර්ථවත් පැවිදි ජීවිතය ඇරඹෙන්නේ ගෙඩියෙනි.

මෙහි ආනිසංස සලකා බලන විට හේතුඵල ධර්මතාවය තුළින්. ප්‍රධාන විමසා බැලිය යුත්තේ ගෙඩියකින් සිදුවන කාර්යභාරය කුමක් ද සහ එම ගෙඩි පූජාව සිදු කරන්නේ කවුරුන් උදෙසාද කියන කාරණා දෙකයි.

ඒ අනුව පළමුව දැක්වූ පරිදි මෙම ගෙඩි පූජාවකින් සිදුවන සාසනික කාර්යභාරය කාර්යභාරය කුමක්දැයි විමසා බැලීමේදී, පුරාතනයේ පටන්ම මේ ගෙඩිය භාවිතා වූවා සේම බුද්ධ කාලයෙහි පෙර බුද්ධ ශාසන වලත් භික්ෂූන් වහන්සේලාගේ එක් රැස්වීමට භාවිතා වන්නේ මෙම ගෙඩියයි.

මෙය බව බොහෝ බෞද්ධ මාතික මාතාදී කතා පුවත්ද ත්‍රිපිටක සූත්‍ර ධර්ම ජාතකාදිය තුළ සඳහන් වේ.

ඉතින් පින්වත් අප පිරිස විසින් ඇහැළ ගස් වලින්. සකසා ආරණ්‍ය සේනාසන සියයක් උදෙසා සිදුකෙරෙන මෙම ගෙඩි පූජා පූජා සියය තුළින්... සිදුවන කාර්යභාරය මෙසේ පෙළ ගැසුවහොත්, පින්වත් ආරණ්‍යවාසී යෝගී ස්වාමීන් වහන්සේලාගේ උතුම් පින්බර වත් පිළිවෙත් සරු ජීවිතයට මහත් උපකාරයක් ලෙස සකසා පූජා කරන මෙම ගෙඩි පූජාවෙහි ආනිසංස සලකා බලන විට... මේ විශ්වයෙහි උතුම්ම මග වන නිවන් මඟ වඩන පූජනීය යෝගාවචර ස්වාමීන් වහන්සේලා දිනය අරඹන්නේ වෙන ගෙඩිය හැඬ වීමෙනි.



එයින් ඇරඹෙන පින්වත් ජීවිතය තුළ එදිනෙදා සිදුවන සෑම විශේෂ කටයුත්තක්ම දැනුවත් වීමට මෙම ගෙඩිය භාවිතා වේ.
එනම්, - නවදහස් එකසිය අසූ කෝටි පනස් ලක්ෂ තිස් හය දහසකින් යුතු වන ගරු උපසම්පදා සීල පාරිශුද්ධිය පිණිස මසකට දෙවතාවක් සිදු වන උපෝසථ විනය කර්මයට සංඝයා එකතු වන්නේ මෙම ගෙඩිය හැඬ වීමෙනි.
එසේම මහා වටිනාම දිවියක තවත් දිනය ඇරැඹුනු බව ගෙඩිය හැඬ වීමෙන් දැනගනී.

එසේ දිනය ඇරඹී ස්වාමීන් වහන්සේලාට බුද්ධ වන්දනාව සඳහා දැනුම් දෙන්නේ ද මෙම ගෙඩි නාදයයි. ඉන්පසු හීල දානය සඳහාත්, දහවල දානය සඳහාත් ස්වාමින් වහන්සේලා එය දැනුවත් වන්නේ මෙම ගෙඩි නාදයෙනි. ඉන්පසු සවස බුද්ධ වන්දනාව සඳහා දැනුවත් වන්නේත් මෙම ගෙඩි නාදයෙනි. එසේම හදිසි අනතුරු අවස්ථාවක් ආපදාවක් සංඝයා එකතු වෙති. විශේෂ කාරණාවක් ගැන දැනුවත් වන්නේ ද මෙම ගෙඩි නාදයෙනි. ඉන්පසු ආරණ්‍ය සිදුවන විශේෂ පින්කම්. භාවනා වැඩසටහන් වැනි දෙය ගැන ද ස්වාමීන් වහන්සේලා දැනුවත් වන්නේ මෙම ගෙඩි නාමය තුළිනි. එසේම සංඝ සාමගිය පිණිස සංඝයා එකතු වී බොහෝ ධර්ම විනයානුකූල කටයුතු කතාබහ කර ගන්නේ ද ගන්නේද මෙම ගෙඩි නාදය තුළිනි...

මෙසේ සංඝයාගේ සියලු කුඩු මහත් කටයුතු වලදී උන්වහන්සේලාව දැනුවත් කරවමින්. බොහෝ කුටි ගණනයේ බොහෝ ස්වාමීන් වහන්සේලාට පණිවිඩ රැගෙන ගොස් වෙහෙසවීමට වන වෙහෙස වළක්වමින් ස්වභාවික ලෙස බණ භාවනා වඩින ස්වාමීන් වහන්සේලාගේ සිත හිමීට සමාධිමත් ව එයින් අවදි කිරීමට සමත් මෙම ස්වභාවික ගෙඩි නාදය සහිත මෙම ගෙඩි පූජාව යනු සාමින් වහන්සේ ලාගේ මුළු ජීවිතයම එක්තැන් කරන කාල මාපකයකි....මේ සියලු කටයුතුවලින් උතුම් මහා සංඝරත්නයට සිදු වන ආනිසංශ සලකා බලන විට.මේ ගෙඩි නාදයකින් හැමවිටම උන් වහන්සේලා යොමු කරන්නේ දාන සීල භාවනා සීල සමාධි ප්‍රඥා කියන ත්‍රිශික්ෂාවන් වෙතය. නොහොත් ශාසනික වත පිලිවෙත සංඝ සාමග්‍රිය. ආදී සියලු සඟ කටයුතු සංඝ කිස සිහිපත් කරවීමයි. ඒ හරහා උන්වහන්සේලාට ප්‍රධානම දියුණු වන්නේ තමන්ගේ සීල සමාධි ප්‍රඥා ය...

එසේ එකතුව සීල සමාධි ප්‍රඥා වැඩීම තුළ තමන්ට ලෝකයට සෙත ශාන්තිය හා යහපත සලසන ආකාරය ගැන කතා බහ කිරීම තුළත්, එසේ එකතුව කටයුතු කිරීම තුළ එසේ සංඝ සාමග්‍රිය ගොඩනැගීම තුලිනුත් මෙය ලොව උතුම්ම නිවන් මඟ ගමන් කරන මහා සංඝරත්නයෙහි උතුම් ජීවිතයත් ඒ හරහා යහපත ලබන. සිව්වනක් පිරිසගේ ම ජීවිතයත් ඉමහත් දියුණුවට පත්වේ..

## දස වස්තුක මිථ්‍යා දෘෂ්ඨිය

1. **"නත්ථි දින්නං"** - දුන් දේ විපාකයක් නෑ කියලා කෙනෙක් හිතනවා නම් එය මිථ්‍යා දෘෂ්ඨියක්.

2. **"නත්ථි යිට්ඨං"** - පූජා සත්කාර වැඳුම් පිදුම් කිරීමේ විපාකයක් නෑ කියලා හිතනවා නම් එය මිථ්‍යා දෘෂ්ඨියක්.

3. **"නත්ථි හුතං"** - මහා පරිමාණයෙන් කරන පූජා සත්කාර ආදියේ ආනිශංස නෑ කියලා හිතනවා නම් එය මිථ්‍යා දෘෂ්ඨියක්.

4. **"නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකෝ"** - හොඳක් කළොත් හොඳ විපාක. නරකක් කළොත් නරක විපාක නෑ කියලා හිතනවානම් එය මිථ්‍යා දෘෂ්ඨියක්.

5. **"නත්ථි අයං ලෝකෝ"** - අපට ලෝකයක් නෑ, ඒ කියන්නේ මේ ලෝකය සදාකාලිකයි .මේ ලෝකයේ අප ඉන්න ටිකේ හොඳට කාලා බීලා සතුටින් ඉමු කිය කියා හිත හිතා කටයුතු කරනවා නම් එතැන තියෙන්නේ මිථ්‍යා දෘෂ්ඨියක්.

6. **"නත්ථි පරලෝකෝ"** - මේ ලෝකයට පස්සේ අපට නැවත උප්පත්තියක්, පරලොවක් නෑ කියලා හිතනවා නම් එයත් මිථ්‍යා දෘෂ්ඨියක්.

7. **"නත්ථි මාතා"** - අම්මාට උපස්ථාන කිරීමෙන් අපට ආනිශංස නෑ. අපට වැඩක් නෑ ප්‍රයෝජනයක් නෑ. කියලා හිතනවා නම් එයත් මිථ්‍යා දෘෂ්ටියක්.

8. **"නත්ථි පිතා"** - පියාණන්ට උදව් කිරීමෙන්, උපස්ථාන කිරීමෙන් අපට ප්‍රයෝජනයක් නෑ. විපාකයක් නෑ කියලා හිතනවා නම්, එයත් මිථ්‍යා දෘෂ්ඨියක්.

9. **"නත්ථි සත්තා ඕපපාතිකා"** - මේ ලෝකයේ ඕපපාතික සත්වයන් නෑ කියලා හිතනවා නම් , විශේෂයෙන් ම ඕපපාතික දෙවියන්, ඕපපාතික බ්‍රහ්මයන්, ඕපපාතික අසුරයන්, ඕපපාතික නාගයන්, ඕපපාතික නිරයගත සතුන් පිලිබඳවත්, විශේෂයෙන් මනුස්සයන් ගැනත් විශ්වාසයක් නැත්නම් එයද මිථ්‍යා දෘෂ්ඨියක්. අපේ බුද්ධ කාලයේ ඕපපාතික ලෙස දෙන්නෙක් පහළ වෙලා තිබෙනවා. චිංචිමානවිකාව පහළ වුණේ සැවැත්නුවර සියඹලා ගසක් යට. අම්බපාලි ගණිකාව විශාලා මහනුවර ලිච්ඡවී දරුවන්ට අයිති අඹ උද්‍යානයේ තිබෙන අඹ ගසක් යට අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් නැතිව අවුරුදු 16-18 කියන තරුණ වයසේ දී පහළ වුණා. මෙන්න මේක තමයි ඕපපාතික උප්පත්තිය. එතකොට ඒවාගේ උප්පත්තියක් ගැන විශ්වාසයක් නැතිනම් මිථ්‍යා දෘෂ්ඨියක්.

10. **"නත්ථි ලෝකේ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමංච ලෝකං පරං ච ලෝකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදේති"** - මේ ලෝකයේ යහපත් මග කියාදෙන නිවැරැදි මාර්ගය පෙන්වා දෙන සිල්වත්, ගුණවත්, උතුමන් බ්‍රාහ්මණයන් නෑ කියලා කෙනෙක් හිතනවා නම් එයත් මිථ්‍යා දෘෂ්ඨියක්.

(මජ්ඣිමනිකාය - උපරිපණ්ණාසකො - අනුපදවග්ගො - මහාචත්තාරීසක සුත්තං)

## මෙත් සවිය තරුණ කමිටුව

මෙත්සවිය තරුණ කමිටුව, විශේෂයෙන්ම මෙත්සවිය තරුණ පිරිස සඳහාම වෙන් වූ කමිටුවයි. තම තරුණ කාලය, දෛනික කාර්යන්ට අමතරව, බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් අර්ථාන්විතව කැප කරමින් මෙත්සවිය කටයුතු වලදී අවශ්‍ය දායකත්වය නොපමාව ලබා දෙන කමිටුවයි.

2018 වර්ෂයේ සිට ස්ථාපිත කරන ලද මෙත්සවිය නව තරුණ කමිටුවේ සාම්ප්‍රදායික කාර්යභාරයන් ඒ අයුරින්ම පවත්වා ගනිමින්, නව ව්‍යාපෘති ද ඇතුලත් කරමින් මෙත්සවිය සංවිධානයේ උතුම් අරමුණු සාක්ෂාත් කරගැනීමට හැකි සෑම ශක්තියක්ම ලබාදීම අපගේ අරමුණයි.

අපගේ කාර්යභාරයන් අතර මෙත්සවිය සාමාජිකයන් සඳහා ''අසරණ සරණ කැට'' නොමිලේ ලබාදීම සුවිශේෂී වේ. එමගින් සාමාජිකයන්ට මරණයට කැපවූ හෝ අසරණ වූ සතුන් නිදහස් කිරීමට පහසුවෙන්ම දායක විය හැකි අතර එය මහා ආනිශංස ගෙන දෙන පිංකමකි. එම මුදල් පරිත්‍යාග වලින් මේ වන විට හරකුන්, පාත්තයින්, තාරාවුන්, කුරුල්ලන්, නයින් ඇතුළු අප්‍රමාණ සතුන් පිරිසකට ජීවිත දානය ලැබී ඇත.

එමෙන්ම නව ව්‍යාපෘතියක් ලෙස භාවනායෝගීන්ට ප්‍රමිතියකින් යුත් කසිණ මණ්ඩල තනවා ලබා දීමද අප විසින් ආරම්භ කර ඇත.

මේ ආකාරයෙන් තාරුණ්‍යයේ ජවය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් කැප කරමින් මෙත්සවියට ශක්තියක් වන ප්‍රධාන අනු කමිටුවක් ලෙස අපගේ කාර්යභාරයන් ඉදිරියටත් නොකඩවා පවත්වාගෙන යාම අප කමිටුවේ බලාපොරොත්තුවයි..

**සුරත් චතුරංග**
**සභාපති - මෙත් සවිය තරුණ කමිටුව**

## මෙත්සවිය මාධ්‍ය ජාලය (මෙත් සවිය TV)

මෙත්සවය මාධ්‍ය ඒකකය 2021 නොවැම්බර් මාසේ ආරම්භ වූ අතර මෙත් සවිය සංවිධානය විසින් සිදුකරන සියලු සද්කාරයන්හි මාධ්‍ය කටයුතු ආවරණය කරනු ලබයි.

මෙහිදී මෙත්සවය සංවිධානයෙන් වාර්ෂිකව සිදු කරනු ලබන සියලු ක්‍රියාකාරකම්, පුණ්‍යපුණ්‍යකර්ම, දානමය කටයුතු, විවිධ ස්ථානයන්හි බෞද්ධ ශාසනයේ චිරස්ථිතිය උදෙසා කරනු ලබන කටයුතු සම්බන්ධයෙන් මාධ්‍ය ආවරණය මෙත් සවිය TV වෙතින් සිදුවෙයි.

මෙත් සවිය නිර්මාතෘ මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමන්ගේ උසස් අධ්‍යාත්මික චින්තනයකින් යුතු පුරවැසියන් ජනගත කිරීමේ මෙත් සවිය ඵලදායී වැඩපිළිවෙළේ සාර්ථකත්වය උදෙසා දායකත්වය ලබාදීමට හැකිවීම පිළිබඳව මෙත් සවිය මාධ්‍ය යෙන්ම ජාලය ලෙස අප සතුටට පත් වෙමු. මෙත් සවිය සංවිධානය මහාචාර්ය චන්දනා ජයරත්න මැතිතුමන් හා එක්ව සිදුකරනු ලබන මේ මහා කර කර්තව්‍යයේ යහපත් ආකල්ප හා සංකල්ප ජනගතව දයාවන්ත සමාජයක් බිහිවේවායි අප ප්‍රාර්ථනය කරමු.

**මෙත්සවය ටීවී/ මෙත් සවිය මාධ්‍ය ජාලය**

## සුවසෙත කමිටුවේ ප්‍රගති සමාලෝචනය

අපේ මෙහෙවරින් බිඳක්........

අප කමිටුව මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ අනු කමිටුවක් වශයෙන් ක්‍රියාකාරී දායකත්වයක් දරනු ලැබේ. මෙහි සාමාජිකයන් භාවනා පුහුණු වැඩසටහන සපුරා ගෙන පංච අභිඥා පාඨමාලා පුහුණුව ලැබූ කණ්ඩායමකින් සමන්විත වේ. සුවසෙතෙ කමිටුව මගින් 2023-2025 වර්ෂයන්හිදී සිදුකරන ලද මෙහෙවරින් බිඳක් මෙහි සටහන් කරන්නෙමු.

1.වාර්ෂිකව පවත්වන ලේ දන්දීමේ කඳවුර

මෙම වැඩසටහන මෙවරත් මවුන්ට් මේරි හි ඥානසීහ ආරාමයේදී මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමාගේ ජන්ම දිනය වෙනුවෙන් පවත්වන ලදි. මෙහිදී රුධිරයේ දායකයන් 400 කට අධික පිරිසක් ලේ පරිත්‍යාග කරන ලදි.

2. අක්ෂි සායනය/2024

ශ්‍රී ලංකාරාමය විහාරස්ථානයේ පවත්වන ලද මෙම අක්ෂි සායනය සඳහා දායකත්වය දැරීම.

3.රෝහල් සේවය

ආරෝග්‍යශාලා සේවා මණ්ඩලය සමග එක්ව කොළඹ ජාතික රෝහලේ වකුගඩු ඒකකයේ (රුධිර කාන්දු කරන) රෝගීන්ට අවශ්‍ය ද්‍රව්‍යමය පරිත්‍යාග සිදු කිරීම.

4.අධි මානසික චිකිස්තාව මගින් රෝගීන් සුව කිරීම.

මෙහිදී අධිමානසික ශක්තිය යොදා ගනිමින් ඖෂධ භාවිතා නොකර රෝග සුවපත් කිරීම සිදු කෙරේ. පංච 'අභිඥා පාඨමාලාව හැදෑරුවන්ට පුහුණුව ලබාදීමද සිදු කෙරේ.

5. සෙසු කටයුතු

- ධර්ම දානමය පින්කම්
- ඖෂධ ගැනීමට මුදල් නැති අයට ඖෂධ ලබාදීම

6. 2025 වසරේ යෝජිත ක්‍රියාකාරකම්

- සුවපත් හදවතකට සංගීත චිකිත්තාව වැඩසටහන
- ප්‍රථමාධාර වැඩසටහන
- මිතුරු පියස සේවාව හඳුන්වාදීමේ වැඩසටහන
- වෘත්තීමය ආතතිය කළමනාකරණය පිළිබඳ වැඩසටහන

**අතුල නානායක්කාර**
**සුවසෙත කමිටු සභාපති**

## මෙත්සවිය අසරණ සරණ කමිටු සුභාශිංශනය

මෙත්සවිය මෛත්‍රී සංසදය මගින් කරගෙන යන මෙම උතුම් කාර්ය සඳහා මෙත්සවිය අසරණ සරණ කමිටුව නන් අයුරින් දායකත්වය ලබා දී ඇති අතර එහිදී අසරණ පවුල්වලට පිහිටවෙමින්, මරණයට කැප වුන අසරණ සතුන් නිදහස් කරමින් දායකත්වය ලබා දෙන අතර 22වන සංවත්සරය වෙනුවෙන් හෘදයාංගම සුභාශිංශන පිරිනමමි.

# මෙත්සවිය සාමණේර භික්ෂු පුහුණු වැඩසටහන හා මෙත්සවිය පෙරපාසල...........

මහාචාර්ය චන්දන ජයරත්න ගුරු පියාණන්ගේ උතුම් සංකල්පයක් ලෙස 'තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ භික්ෂු ශාසනයේ ආරක්ෂාව හා චිරස්ථිතිය' උදෙසා ඇරඹි මෙත්සවිය සදහම් අරණ භික්ෂු පුහුණු මධ්‍යස්ථානය හා පෙර පාසල 2021 වර්ෂයේ සිට අඛණ්ඩව ඒ උතුම් අරමුණ සාක්ෂාත් කර ගනිමින් සිටින අතර ඒ සඳහා තම කාලය ශ්‍රමය ධනය වැය කරමින් විශාල පිරිසක් තම දායකත්වය ලබාදෙන අතර මෙත් සවිය ධර්මදූත ඒකකය ස්ථාපිත ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙනෙහි විහාරාධිපති මහාවිහාරවංශික කෝට්ටේ කල්‍යාණ ශ්‍රී ධර්ම මහා සංඝසභාවේ දකුණු පළාතේ ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රපති පූජ්‍ය වැලිවිටියේ සීවලී නාහිමියන්ගේ හා විහාරමහාදේවී පිරිවෙනෙහි විහාරාධිපති පූජ්‍ය මානම්පිට විජිත ස්වාමීන් වහන්සේ ඇතුළු විහාරවාසී ආර්ය මහා සංඝරත්නයෙන් ලැබෙන උපකාරය හා ශක්තිය ද ඉතා ගෞරවයෙන් පාද නමස්කාර පූර්වකව සිහිපත් කරමින් මෙත්සවිය මනස අධ්‍යාපන මෛත්‍රී සංසදයේ 22 වන සංවත්සරය සැමරුම් උළෙල සඳහා හෘදයාංගම සුබ පැතුම් එක් කරන්නෙමු.

**මෙත්සවිය සාමණේර භික්ෂු පුහුණු වැඩසටහන හා**
**මෙත්සවිය පෙරපාසල සම්බන්ධීකාරක**
**රුෂාන්ති දහනායක**

## කාන්තා එකමුතුවෙන්

ලෝක සම්මතයෙන් වසරක් ගෙවී වසරක් උදාවන අවස්ථාවේ මෙත්සවිය සාමාජික සාමාජිකාවන් අපගේ ගුරු පියාණන් සමඟ එක්ව ආගමික කටයුතුවල නියැලීම සිරිතයි. සෑම අවුරුද්දක් ආරම්භයේ මෙන් මෙවරද කොළඹ ගංගාරාමයේ පැවති දානමය පින්කම සාමාජික සාමාජිකාවනගේ සහභාගිත්වයෙන් ඉතාමත් සාර්ථකව සිදුකිරීමට කාන්තා එකමුතුවට හැකි වීම ඉමහත් සතුටකි.

සතිපතා ඉරුදින පැවැත්වෙන භාවනාමය වැඩසටහන් වලදී මෙන්ම විශේෂ අවස්ථාවන්හිදී ද සිදුකරන සංග්‍රහ කටයුතු සෑම දෙනාගේම සහභාගීත්වයෙන් මෙන්ම ඉතාම උනන්දුවෙන් ඉදිරිපත් වී ලබාදෙන දායකත්වයෙන් ඉටුකිරීමට කාන්තා එකමුතුවට හැකිවිණි.

පසුගිය වසරේ වෙසක් උත්සවය නිමිතිකරගෙන සිදුකළ බඩඉරිඟු දන්සැල කාගේත් ප්‍රශංසාවට ලක් වූ අතර මෙවරද එවැනි දන්සැලක් පැවැත්වීමට දැනටමත් කටයුතු සූදානම් කරමින් පවතී. මෙත්සවිය සාමාජිකත්වය උසුලනය තරුණ දරුවන්, වැඩිහිටියන් සියලු දෙනාම සෑම අවස්ථාවකම කාන්තා එකමුතුවෙහි වැඩකටයුතු වලට ලබාදෙන සහයෝගය ඉතා අගය කළ යුතුය.

විශේෂයෙන් මැදිවිය පසු කරමින් සිටින සාමාජික සාමාජිකාවන් අපේ ගරු මහාචාර්ය තුමන්ගේ මග පෙන්වීම යටතේ තරුණ පිරිස් සමග එක්ව සමාජයට වැඩදායක ක්‍රියාකාරකම්වල නිරත වීමෙන් ලබන මානසික තෘප්තිය ඉතාම වැදගත් බව කාන්තා එකමුතු ගෞරවයෙන් සිහිපත් කරන්නෙමු.

සෑම දෙනාටම තෙරුවන් සරණයි !

## සද්ධර්ම ශ්‍රවණයේ අනුසස් මොනවාද?

1. **අස්සුතං සුනාති** - නො ඇසූ දේ අහන්න ලැබෙනවා. සමහර වෙලාවට තමා දන්නවා කියන මාතෘකාවක් යටතේ වුවත් නො දන්නා කරුණු තිබෙන්න පුළුවන්. එයින් දන්න දහම් කරුණු නැවත නැවත විමසා බලන්නට අවස්ථාව උදා වෙනවා.
2. **සුතං පරියෝදපේති** - ඇසූ දේ වඩ වඩාත් පිරිසුදුව නිරවුල්ව, තේරුම් ගන්න පුළුවන් වෙනවා.
3. **කඞ්ඛං විතරති** - ධර්මයේ සැක සංකා තියෙනවානම් ඒවා දුරුවෙනවා. වැරදි දෘෂ්ඨි වැරදි ලෙස මා තේරුම් ගෙන තිබෙන්නේ කියා සිතෙනවා.
4. **දිට්ඨිං උජුං කරෝති** - ධර්මය නිවන් මග පිළිබඳව දෘෂ්ඨිය, සම්මා දිට්ඨිය සෘජු වෙනවා බණ අසන තරමටම.
5. **චිත්තමස්ස පසීදති** - බණ අසන සිත පිරිසුදු වෙනවා. එනිසා ඇසූ බණ පදයක් වුවත් නැවත නැවත අහන තරමට සිත පිරිසුදු වෙනවා. ඒ නිසා මේ ධර්මය මම අහල තියෙනවා කියලා සිතුවොත් සිත කිලුටු වෙනවා. ඒ තමයි සාමාන්‍ය මිනිසුන්ට බණ ඇසුවාම තිබෙන ප්‍රතිඵල.

ඊළඟට අපේ ධර්මයේ පුද්ගලයෝ වර්ග දෙකක් ඉන්නවා. "සේක" සහ "අසේක" කියලා. සේක කියන්නේ නිවන් මාර්ගයේ තවම හික්මෙන්න ඕන පිරිස. මේ පිරිසේ හත්දෙනෙක් ඉන්නවා. සෝතාපත්ති මාර්ගයේ යන පුද්ගලයා, සෝතාපත්ති පුද්ගලයා, සකෘදාගාමි මාර්ගයේ යන පුද්ගලයා, සකෘදාගාමි පුද්ගලයා, අනාගාමි මාර්ගයේ ගමන් කරන පුද්ගලයා, අනාගාමි පුද්ගලයා සහ අරහත් මාර්ගස්ථ පුද්ගලයා. මේ හත් දෙනා තමා හික්මුණු පුද්ගලයන්. අසේක කියන්නේ හික්මෙන්නට දෙයක් නැහැ නිවන් මගේ හික්මුණු රහතන් වහන්සේයි ඒ. ඒ දෙපිරිසටම තියෙනවා ධර්ම ශ්‍රවණයේ ප්‍රතිලාභ. සේක පුද්ගලයාට ධර්මය අහනවිට හිතෙනවා අපි තව මේ මාර්ගයේ ඉදිරියට යන්න ඕන. අපි තව ලබාගත යුතු මාර්ග තියෙනවා කියලා. ඒ මාර්ගවල ගමන් කරන්න උනන්දුව උත්සාහය ඇතිවෙනවා. අසේක පුද්ගලයා වූ රහතන් වහන්සේත් බණ අහනවා. උන්වහන්සේලා එසේ ධර්මය ශ්‍රවණය කරන්නේ නිරාමිස ප්‍රීතියක් තෘප්තියක් ලැබෙන නිසයි. ඒ සද්ධර්ම ශ්‍රවණයේ තිබෙන ආනිශංසයි.

# මෙත් සවිය කළුතර ළදරු පාසලේ දරුවන්ගේ ක්‍රියාකාරකම්

ළදරු පාසලේ
බක්මහ උළෙල
2024. 04. 09



වෙසක් සීල සමාදාන වැඩසටහන
2024. 05. 21



පොසොන්
සීල සමාදාන
වැඩසටහන
සහ
මල් දන්සල
2024. 05. 21





ලෝක
ළමා දින
සැමරුම්..
2024. 10. 01

ළදරු
පාසලේ
දරුවන්
විසින්
සිදුකල
ශ්‍රමදානමය
අවස්ථාව



මෙත් සවිය පෙර පාසලේ දරුවන්ගේ කෘතවේදී ස්තුතිය






ශ්‍රී:බු:ව: 2568 ක් වූ වෙසක් මස
23 වන පුන් පොහෝදින සහ
24/25/26 යන දින 4ක් මුළුල්ලේ
කොළඹ-07-බෞද්ධාලෝක මාවතේ
පැවත්වූ බඩ ඉරිඟු දන්සැලෙහි
අවස්ථාවන් කිහිපයක්.....



ගරු චන්දන ජයරත්න ගුරුපියාණන්ගේ ජන්ම දිනය හේතුකොටගෙන 2024/09/07 වන දින මෙත් සවිය ධර්මදූත ඒකකය ස්ථාපිත ඇල්පිටිය විහාරමහාදේවි පිරිවෙන්හි වැඩවාසය කරන ස්වාමීන් වහන්සේලා 20 නමක් උදෙසා දහවල් දානය පූජා කළ අවස්ථාව



නිමලව ආරණ්‍ය සේනාසනයේ වැසිකිලි පද්ධතිය ඉදිකිරීම සඳහා ගිය නිරීක්ෂණ චාරිකාව



තිස්සමහාරාම විහාරස්ථානයේ ගරාවැටෙමින් පවතින ධාතු මන්දිරය සහිත බුද්ධ මන්දිරය මෙත්සවිය මූලිකත්වයෙන් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගිය නිරීක්ෂණ චාරිකාව



මියගිය සාමාජිකයින් උදෙසා සිදු කරන ලද
පුණ්‍යානුමෝදනා පූර්වක

# මෙත් සවිය

## අනුස්මරණ පිංකම

2024 දෙසැම්බර් 1 වන ඉරුදින

මෙත්සවිය කමිටු සාමාජික ව සිටි ජී.ජී. තිලකසිරි මහතා ඇතුළු
පසුගිය වසර 21 තුල මෙත්සවියේ මියගිය සාමාජිකයින් සහ
ඔවුන්ගේ පවුල් වල මියගිය අය සඳහා
පුණ්‍යානුමෝදනා පෙරදැරිව බොරැල්ල ශ්‍රී ලංකාරාමයේදී පැවැත් වූ
වාර්ෂික සංඝගත දක්ෂිණාවේ අවස්ථා කිහිපයක්.



**ඓතිහාසික මහියංගනය රාජමහා විහාර භූමියෙහි**
**මෙත්සවිය මගින් රුපියල් කෝටි 28 කට**
**අධික මුදලකින්, පසුපස ආධාරකයක් රහිතව ඉදි කළ**
**ලක්දිව උසම බුදුපිළිම වහන්සේ වන**
**මෙත්සවිය 2600 සම්බුද්ධත්ව ජයන්ති**
**සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ**



2012 ජනවාරි 08 වන දුරුතු පොහෝ දින ඉදිකිරීම් කටයුතු ආරම්භය සඳහා පළමු පස් පිඩැල්ල කැපීම සහ මුල්ගල් තැබීම.



බුදුපිළිම වහන්සේ ඉහලට නැංවීමේ දෙවන අදියර 2013 ජනවාරි 26 වන දින මහත් උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.



බුදුපිළිම වහන්සේ ඉහලට නැංවීමේ තෙවන අදියර ලෙස 2014 ජූලි 26 වන දින පද්මයෙන් උස කොටස තැනීම සඳහා මුල්ගල තැබීම මහත් උත්සවාකාරයෙන් ආරම්භ කිරීම.



2018 - 10 - 28 දින පිළිම වහන්සේගේ නිර්මල වූ හදවත් පෙදෙසෙහි ධාතු ගර්භයෙහි නිධන් කිරීම පිණිස ත්‍රිපිටක සූත්‍ර ලියන ලද රන් පත්තිරු සහිත මංජුසා තැන්පත් කිරීම සඳහා රන් පත්තිරු මත ත්‍රිපිටක අක්ෂර ලිවීමේ පුණ්‍යකර්මය



2019 දෙසැම්බර් 09 වන දින බුදුපිළිමය තැනීම පිළිබඳ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වූ මාධ්‍ය සාකච්චාව



2019 දෙසැම්බර් 09 වන දින බුදුපිළිමය තැනීම පිළිබඳ බෞද්ධයා රූපවාහිනියේ දී පැවැත්වූ මාධ්‍ය සාකච්චාව.



2020 - 01 - 10 දුරුතු පොහෝ දින බුද්ධ ප්‍රතිමා වහන්සේගේ ලය පෙදෙසෙහි කෝටි ගණනක් වටිනා රන්, මුතු, මැණික් තැන්පත් කිරීමේ ගර්භ නිධානෝත්සවය.



2023 මැයි 05 වෙසක් පොහෝ දින පිළිම වහන්සේගේ ශීර්ෂයෙහි සර්වඥ ධාතූන් වහන්සේලා තැන්පත් කිරීම.



2023 මැයි 18 දින රුපියල් කෝටියක් පමණ වටිනා ඌර්ණ රෝම ධාතූන් වහන්සේ තැන්පත් කිරීම සහ පිළිම වහන්සේගේ ශීර්ෂයෙහි පළිඟු කැට තැන්පත් කිරීම.



2023 මැයි 28 දින මෙත්සවිය 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ නිමකොට විවෘත කිරීමේ පුණ්‍ය මහෝත්සවය



# 21 වන සංවත්සර සැමරුම සහ මෛත්‍රී භූෂණ උපහාර උළෙල

මෙත් සවිය
මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## මෛත්‍රී භූෂණ තිළිණ ප්‍රදානය





රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පූජ්‍ය
රජවැල්ලේ සුභූති හිමියන් වහන්සේ වෙත
මෛත්‍රී භූෂණ විශ්ව කීර්ති ශ්‍රී අසරණ සරණ ශිරෝමණි
ගෞරව සම්මානය පිරිනැමීම





නෙරංජලා කන්නන්ගර මහත්මිය වෙත
මෛත්‍රී භූෂණ දෘෂ්ටි විශෝධන ශිරෝමණි
ගෞරව සම්මානය පිරිනැමීම







බුද්ධ ශාසන සංස්කෘතික හා ආගමික කටයුතු පිළිබඳ
ගරු අමාත්‍ය විදුර වික්‍රමනායක
මැතිඳුන් වෙත උපහාර තිළිණ ප්‍රදානය



ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙන වෙත
උපහාර තිළිණ ප්‍රදානය

## උපහාර තිළිණ ප්‍රදානය



නිමේෂ් ශෂින්ත මහතා



රංජනී උඩුගොඩ මහත්මිය



රුෂාන්ති දහනායක මහත්මිය



නිලූකා ජයසිංහ මහත්මිය



පුන්‍යා නිශාන්ති මහත්මිය



සුසන්ත හේරත් මහතා



කේ.ආර්.ජී. දූල්වල මහත්මිය

# ධර්ම දේශණා වැඩසටහන්



2024.05.05 වන ඉරු දින පැවැත් වූ 21 වන සංවත්සර සැමරුම් උළෙල නිමිති කොට පැවැත් වූ යුගාසන කවි බණ දේශණාව

දේශකයාණෝ -
පූජ්‍ය කඹුරුගමුවේ ගෝතම හිමි සහ ලෙල්ලොපිටියේ සුපේෂල සාමණේර හිමි.



මෙත්සවිය නිර්මාතෘ මහාචාර්ය චන්දන ජයරත්න ගුරුපියාණන්ගෙ ජන්ම දිනය නිමිති කරගෙන 2024 සැප්තැම්බර් 08 වන ඉරු දින සවස 3.00 ට කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ ධම්මගවේෂී බෞද්ධාශ්‍රමයේදී පැවැත්වූ ධර්ම දේශණය

දේශකයාණෝ -
පැලැන්වත්ත අශෝක අරණේ විහාරාධිපති පූජ්‍ය බේරුවල රාහුල හිමි.

## ලෝක භාවනා දිනය නිමිත්තෙන් මෙත් සවිය මගින් 2024/12/21 දින බොරැල්ල ශ්‍රී ලංකාරාමයේදී පවත්වන ලද විශේෂ වැඩ සටහනේ ඡායාරූප පෙළක්










2024 - 12 - 21 දින ශ්‍රීමත් අනගාරික ධර්මපාල පරෝපකාර පදනම මගින් මෙත් සවිය භාණ්ඩාගාරික
**එච්. එම්. චින්තක යුරාජ් බණ්ඩාර මහත්මාණන්**
**"ශාසනසේවා කීර්ති දේශබන්දු යන කීර්ති නාමයෙන්"**
පිදුම් ලැබූ වගයි.





## 2024.09.08 ඉරුදින කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ ධම්මගවේශී බෞද්ධාශ්‍රම ශාලාවේදී පැවැත්වූ මෙත්සවිය ස්වයංපෝෂණ වැඩසටහන

මෙම වැඩසටහනේදී බිම්මල් වගාව සහ වැනිලා වගාව පිළිබඳ දැනුවත් කිරීමේ දේශන පැවැත්විනි.



හතු වගාවට උපදෙස් ලබාදුන්
මෙත් සවිය සාමාජික
අජිත් විජේසිංහ මහතා
**0777699393**



වැනිලා වගාවට උපදෙස් ලබාදුන්
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
දිල්රුක්ෂි රත්නායක මහත්මිය'
**0718063048**



# කොළඹ ගංගාරාම විහාරස්ථානයේ

## 2025 ජනවාරි 1 වන දින වසරේ පළමු හීල්දානමය පිංකම

**සෑම වර්ෂයකම සිදු කරන වසරේ ප්‍රථම හීල් දානමය පිංකම මෙත් සවිය කාන්තා කමිටුවේ සංවිධාන ශක්තියෙන් සහ සාමාජිකයින්ගේ ආධාර උපකාරයෙන් හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී සිදු කරන ලදී**








ජනවාරි 01 දින සිදු කරන ලද කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි ජයන්ති ළමා නිවාසයේ දරුවන් සඳහා දහවල් දානය හා අත්‍යාවශ්‍ය භාණ්ඩ පරිත්‍යාග කිරීම.





2025 ජනවාරි 01 දින ගංගාරාමයේදී පාත්තයන් සහ ගේ කුරුල්ලන්ට අභය දානය ලබා දීමේ අවස්ථාව.

මෙත්සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ නිර්මාතෘ
ගරු චන්දන ජයරත්න මැතිතුමාගේ උදාර සංකල්පයක් ලෙස
තථාගත සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ භික්ෂු ශාසනයේ ආරක්ෂාව හා චිරස්ථිතිය උදෙසා ඇරඹී
මෙත්සවිය ධර්මදූත ඒකකය ස්ථාපිත ඇල්පිටිය විහාර මහා දේවි පිරිවෙණෙහි අධ්‍යාපනය ලබන
සාමණේර ස්වාමීන් වහන්සේලාගේ වාර්ෂික සදහම් චාරිකාව,
මෙවර අමාමෑණී ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාද පද්මය රැඳවූ සිරිපා වන්දනාව,
ශ්‍රී දළදා වන්දනාව හා නෙල්ලිගල ආරණ්‍ය සේනාසනයේ පුදබිම වන්දනා කල අවස්ථා.








මෙත්සවිය කළුතර ළදරු පාසලේ දරුවන් විසින් ජාතික නිදහස් දිනය සමරා
ගීත ගායනය සහ පැළ සිටුවීම









# අධ්‍යාපන වැඩමුළුව 2025

**2025 03 02 වන දින කොළඹ, විශ්ව විද්‍යාලයේ විද්‍යාපීඨ පරිශ්‍රයේ නව කලාගාර ශාලාවෙහි පැවැත් වූ සාර්ථකව ඉගෙන ගන්නා ක්‍රම සහ විභාග සමත් වීමේ ක්‍රම පිළිබඳ වැඩමුළුව**








"උගත මනා ශිල්පයමයි - මතු රැකෙනා"

## මෛත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය මඟින් පවත්වනු ලබන

**සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන ක්‍රම පිළිබඳව වැඩමුළුව.**

සංසදයේ සාමාජිකයින්ට සහ ඔවුන්ගේ දරුවන්ට නොමිලයේ පවත්වන අතර, සංසදයේ සාමාජිකයින් නොවන අයට හා වයස අවුරුදු 12 ට වැඩි පාසල් ළමුන්ට ද මේ සඳහා සහභාගී විය හැකිය. ඔවුන් සඳහා ප්‍රවේශ පත්‍රය : රුපියල් 1000/-

සහභාගී වීම සඳහා අප පරිපාලක නිලධාරී මහතා අමතා 2025.02.28 වෙනි දිනට පෙර ලියාපදිංචි විය යුතුය.

මුද්‍රිත සටහන් සපයනු ලැබේ.

Accelerated learning techniques, High speed reading / writing, Memory improving techniques, NLP & Mind maps, Identificationof Auditory, Visual and Kinesthetic sub modalities and how to select the best method for you to study, Preparation for exams, Brain exercies to increase results Auto suggestions, At the examination - how to manage time to get a good results

2025.03.02 ඉරු දින පස්වරු 1.00 සිට 5.00 දක්වා කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාපීඨ පරිශ්‍රයේ නව කලාගාරයේ දී...

දේශන පැවැත්වෙනුයේ සිංහල මාධ්‍යයෙනි


**071 40 14467 / 0112 50 5088**

ප්‍රධාන දේශක:

**මහාචාර්ය චන්දන ජයරත්න මහතා**

මෛත්‍රීනට සතිපතා ඉරුදින සවස පැවැත්වෙන සමථ විපස්සනා භාවනා වැඩසටහන නොපැවැත්වේ.

























මෙහි එකොළොස්වන කොටස පසුගිය කලාපයේ පළ විය...

# කෙලෙස් 1500

## 13 වන කොටස



**අති පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමියන්ගේ ලිපියක් ඇසුරිනි.**

### 45. ලපනා

ප්‍රත්‍යයන් ලැබෙන පරිදි කථා කිරීම ලපනා නම් වේ. ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා බලාපොරොත්තු වන, ඒවාට ගිජු වූ කථාවෙහි දක්ෂ වූ ඇතැම් කුහක පැවිද්දෝ කථාවෙන් ඒවා ලබා ගැනීමට උත්සාහ කරති. කථාවෙන් ප්‍රත්‍යය ලැබීමට බලාපොරොත්තු වන කුහක පැවිද්දා විහාරයට ගිහියකු පැමිණි කල්හි මහත්මයා ආයේ ආරාධනාවක් කරන්නටද? මහත්මයාට කොපමණ භික්ෂූන් වුවමනාද? වුවමනා පමණක් භික්ෂූන් මට වැඩම කරවා දිය හැකිය යනාදීන් කථා කරති. අසවල් ඇමතිතුමා අසවල් මන්ත්‍රීතුමා අසවල් මහත්මයා අපගේ දායකයෝය, මෙහි නිතර පැමිණෙන්නෝය යනාදීන් තමාගේ උසස් බව පෙනෙන්නට කථා කරයි. මේ මහත්මයා, මේ මහත්මිය හොඳට පින් කරන අයය, අතීතයේ මෙසේ පින් කර ඇති අයය, මහා දානපතියෝය, දීමට යමක් ඇතියෝය යනාදීන් උසස් කොට කථා කරයි. මේ මහත්වරු අන් අවුරුදු වල නම් මේ මාස වලදී පින්කම් කරන්නෝය, දන් දෙන්නෝය, මේ වර්ෂයේ තව ම නැත්තේ අවකාශ නො ලැබූ නිසා ද යනාදීන් දෙමිය කියන තෙක් නොයෙක් ලෙසින් කථා කරයි. මේ පවුලේ අය සෝවාන් පුද්ගලයන් වැනියෝය, යමක් ලදහොත් අප අමතක නො කරන්නෝය, හොඳ දෙයක් ලද හොත් එය අපට ම දෙන්නෝය යනාදීන් බොරු කරුණාව මෛත්‍රිය හිතවත්කම දක්වා කථා කරයි. දායකයා සතුටු වන පරිදි ඔහු කියන කුමක් වුව ද සත්‍යය, ධර්මය අපේක්ෂා නො කොට අනුමත කරමින් කථා කරයි. බොරු සැබෑ මිශ්‍ර කොට කථා කරයි. දායකයන් ගේ දරුවන් සුරතල් කරයි. මේ කථාවෙන් ප්‍රත්‍යය ලබාගන්නා ආකාරය ය.

### 46. නේමිත්තිකතා

තමන්ට වුවමනා දෙය ගිහියන්ගෙන් කෙළින්ම ඉල්ලීමක් නො කොට එය ලබා ගැනීම පිණිස කයින් හෝ වචනයෙන් හෝ යම්කිසි නිමිත්තක් දැක්වීම නේත්තිකතා නම් වේ. නේමිත්තිකතාව පිළිබඳව විභංග අටුවාවෙහි එන කථාවක් මෙසේය.

එක් ජාතක භාණක භික්ෂුවක් දිනක් වැළඳීමේ බලාපොරොත්තුවෙන් එක් උපාසිකාවකගේ නිවසකට ඇතුළු වී හිඳ ගත්තේය. භික්ෂුවට සංග්‍රහ කිරීමට කැමති නො වූ උපාසිකාව 'අද උයන්නට දෙයක් නැත' යයි කියමින් සහල් සෙවීමට යන ආකාරය දක්වා සමීප ගෙයකට ගියාය. භික්ෂුව ඒ අතර ගෙට ඇතුළු වී බලනුයේ ගෙය තුළ එක් තැනක උක් දණ්ඩකුත් භාජනයක සකුරුත් කුඩයක ලුණු මාලු පෙත්තකුත් සැළියක සහලුත් කළයක ගිතෙලුත් තිබෙනු දැක, කිසිවක් නොදන්නාක් මෙන් එළියේ වාඩි වී හුන්නේය. උපාසිකාව 'අද සහල් ටිකක්වත් ලබා ගන්නට නො පුළුවන් වී ය' යි කියමින් ගෙට ආවාය. එකල්හි භික්ෂුව "උපාසිකාවෙනි. අද දානය හරි නොයන බව මා කලින් ම දැන ගත්තාය. අතර මගදී නිමිත්තක් දුටුවෙමි" යි කීය. උපාසිකාව විසින් "ස්වාමීනි, ඒ කුමක්දැයි" යි ඇසූ කල්හි " මම මගදී අර කවුළුව සමීපයේ ඇති උක්දණ්ඩ වැනි සර්පයකු දුටිමි, ඌ පලවා හැරීමට ගැසීමට දෙයක් වටපිට බලන කල්හි අර භාජනයේ ඇති සකුරු කැට වැනි මැටි දැක, ඒවායින් ඌට ගැසුවෙමි. ඌ පෙණය කළේය. උගේ පෙණය අර කුඩයේ ඇති ලුණු මාලු පෙත්ත වැනිය. උගේ දත් අර සැළියේ ඇති සහල් ඇට වැනිය. උගේ කටින් හෙළූ කෙළ අර සැළියේ ඇති ගිතෙල් වැනිය ' යි කීය. උපාසිකාව "මේ මහණ රැවටිය හැකි කෙනෙකු නො වෙති" යි උක් දණ්ඩ දී බත් පිස ලුණු මාලු සකුරු ගිතෙල් සමග භික්ෂුවට දුන්නාය. එසේ රවටා ප්‍රත්‍යය ලබන ස්වභාවය නේමිත්ති කතා නම් ක්ලේශය ය.

### 47. නිප්පේසිකතා

නො දෙන්නවුන්ට ආක්‍රෝශ කිරීම් ආදියෙන් පීඩා කොට ප්‍රත්‍යය ලබා ගන්නා ස්වභාවය නිප්පේසිකතා නම් වේ. නිප්පේසිකතා ඇති පැවිද්දා ප්‍රත්‍යය ලබනු පිණිස නො දෙන්නවුන්ට ආක්‍රෝශ කරයි. පහත් කොට කථා කරයි. මසුරෙක, ශ්‍රද්ධාව නැතියෙක, ලෝභියෙක කියා නින්දා කරයි. මොහු මහා දානපතියෙක, සැමදාම නැතය යන වචනය දෙතිය කියා විසුළු කරයි. මසුරෙකු කියා නො දෙන්නාගේ අවගුණ පතුරවයි. ඉදිරියේදී ගුණ කියා නැති තැන නින්දා කරයි. එසේ කරන භික්ෂුවට ඔහුගේ කරදරයෙන් බේරීම පිණිස නො කැමැත්තෙන් වුව ද දෙති.

### 48. ලාගේන ලාභං නිජිගිංසනතා

ලාභ කාමයෙන් කෙනෙකුගෙන් ලද දෙය අතිකකුට ද ඔහුගෙන් ලද දෙය තවත් කෙනෙකුට ද දීමෙන් වඩා හොඳ දේවල් ලබන තණ්හාව ලාභෙන ලාභං නිජිගිංසනතා නම් වේ. මෙය විභංග ප්‍රකරණයෙහි විස්තර කර ඇත්තේ පිණ්ඩපාතය පිළිබඳව ය. ගෙන් ගෙට පිණ්ඩපාතය ගෙන ගොස් දෙන අය මේ රටේ දක්නට නැත. සමහර විට විදේශ වල සිටිය හැකි ය. කුහනා ලපනා නෙමිත්තිකතා නිප්පේසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතා යන මේ ක්ලේශයන් විස්තර කර ඇත්තේ පැවිද්දන් සම්බන්ධයෙනි.

### 49. සෙයෙ‍්‍යා හමස්මිති මානෝ

සෙය්‍යාහ හමස්මීති මානෝ යනු මම ජාතියෙන් හෝ කුලයෙන් හෝ ගෝත්‍රයෙන් හෝ රූප සම්පත්තියෙන් හෝ තනතුරෙන් හෝ උගත්කමින් හෝ නුවණින් හෝ යම් කිසි ශිල්පයකින් හෝ ශාස්ත්‍රයකින් හෝ වෙනත් කරුණකින් හෝ අන්‍යයන්ට වඩා උසස්ය කියා ඇති වන හැඟීම ය. ආත්මය කොඩියක් මෙන් කොතක් මෙන් උස් කොට සලකන්නා වූ ස්වභාවය ය.

කොටස් වශයෙන් ඊළඟ සගරාවෙන්...

# දුප්පත් වෙලා ඉපදෙන්නේ ඇයි?

අද සමාජයේ අපිට නිතරම අහන්නට දකින්නට ලැබෙන්නේ දුප්පතුන්ගේ දුක් ගැනවිලි අඳෝනා ඇයි මදක් සිතන්න බැරි අපට එහෙම වුනේ ඇයි කියලා අපි දුප්පත් වුනේ අපි ලෙඩ වෙන්නේ අපි අසරණ වෙන්නේ මේ වගේ හිතන්නවත් ඒ අයට ශක්තියක් නැ ඒ තරමටම කර්මය ප්‍රබලයි...

පින්වත් පිරිසක් බුද්ධ පූජා කරද්දි සංඝයා වහන්සේලාට දන් පැන් පුදද්දි වෙහෙරක් විහාරයක් දාගැබක් හදද්දි වුනත් කොටසක් එකටත් විරසක වෙන්නේ ඇයි දුප්පතුන්ට ලෙඩ්ඩුන්ට අසරණයන්ට ඒ යොදවන ප්‍රාග්ධනය යොදවන්න කියලා කෑගසමින් ඒ අය ඇයි මොහොතකට මේ ගැන නොසිතන්නේ ඒ අය අසරණ වුනේ කාගේ වරදකින්ද ඒ අය ලෙඩ වුනේ කාගේ වරදකින්ද ඒ අය දුප්පත් වේලා ඉපදුනේ කාගේ වරදකින්ද කියලා මොහොතකටවත් හිතන්න පුලුවන්නම් අහෝ කොයිතරම්නම් භාග්‍යක්ද?

## කර්මයට අනුව පුද්ගලයා වෙනස් වන අයුරු

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනා-රාමයෙහි වැඩ සිටින කල්හි බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි සුභ මානවකයා උන්වහන්සේ අමතා;

"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ ලෝකයෙහි අඩු ආයුෂ ඇත්තෝ වෙති. වැඩි ආයුෂ ඇත්තෝ වෙති. බොහෝ ආබාධ ඇත්තෝ වෙති. ලෙඩ රෝග ඇත්තෝ වෙති. විරූපී ඇත්තෝ ද වෙති. රූප සම්පත් ඇත්තෝ ද වෙති. මහත් පිරිවර ඇත්තෝ ද වෙති. මහත් පිරිවර නැත්තෝ ද වෙති. වස්තු සම්පත් ඇත්තෝ ද, වස්තු සම්පත් නැත්තෝ ද වෙති. පහත් කුල ඇත්තෝ ද, ආඥානයෝ ද වෙති.

**මේ අයුරින් සත්ත්වයාගේ උස් පහත් භේදයට හේතුව නම් කුමක් ද?"**

එවිට බුදුරජාණන් වහන්සේ විසින් කර්මයම සත්ත්වයාගේ උස් පහත් බවට හේතු වන්නේ යැයි දක්වමින් කර්මය අනුව සත්ත්වයා ආකාර දහ හතරකට බෙදා වදාළ සේක.

### සත්ත්වයා ආයුෂ අඩුවෙන් උපත ලබන්නට හේතු

මානවකය, මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් කිසිදු අනුකම්පාවක්, දයාවක් නැතිව සත්ත්ව ඝාතනය සිදු කරන්නේ ද හෙතෙම ඒ අකුසල කර්මයේ බලයෙන් මරණින් මතු අපායෙහි උපදින්නේය. යම් හෙයකින් මනුෂ්‍ය ආත්ම භාවයට පැමිණිය ද අඩු ආයුෂ ඇත්තෙක් වන්නේ ය.

### සත්ත්වයා දීර්ඝායුෂ ලැබීමට හේතු

මානවකය, මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් සත්ත්ව ඝාතනයෙන් වළකින්නේ ද, සියලු සතුන් කෙරෙහි දයාව අනුකම්පාව දක්වයි ද ඒ තැනැත්තා ඒ කුසල කර්මයේ බලයෙන් මරණින් මතු දිව්‍ය ලෝකයෙහි උපත ලබන්නේ ය. යම් හෙයකින් මනුෂ්‍ය ආත්ම භාවයට පැමිණියෙහි නම් උපදින උපදින සෑම භවයක දීම දීර්ඝායුෂ ඇත්තෙක් වන්නේ ය.

### සත්ත්වයා බොහෝ ලෙඩ රෝග ඇත්තෙක් වීමට හේතු

මානවකය, මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් අතින් පයින් හෝ දඬු මුගුරු වලින් හෝ ආයුධ වලින් හෝ සත්ත්වයනට හිංසා පීඩා කරන්නේ ද හෙතෙම අකුසල කර්ම බලයෙන් අපායෙහි උපත ලබා දුක් විඳින්නේය. යම් හෙයකින් මනුෂ්‍ය ආත්ම භාවයට පැමිණියහොත් උපදින උපදින භවයක් පාසා බොහෝ ලෙඩ රෝග ඇත්තෙක් වන්නේ ය.

### සත්ත්වයා නීරෝගී වීමට හේතු

මානවකය, මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් අතින් පයින් හෝ දඬු මුගුරු වලින් හෝ ආයුධ වලින් හෝ සත්ත්වයන්ට හිංසා පීඩා නො කරන්නේ ද ඒ තැනැත්තා ඒ කුසල කර්මයේ බලයෙන් මරණින් මතු දෙව්ලොව උපත ලබන්නේය. යම් හෙයකින් මනුෂ්‍ය ආත්ම භාවයට පැමිණියේ ද උප නූපන් භවයන්හි නීරෝගී වූවෙක් වන්නේ ය.

### සත්ත්වයා දුර්වර්ණ වීමට හේතු

මානවකය, මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් ක්‍රෝධ කරන්නේ වේද, බලවත් සිත් තැවුලෙන් පෙනෙන්නේ වේද, සුලු වරදක් පෙන්වා දුන් විට පවා කිපෙන්නේ වේද, තරහව උපදවන්නේ ද, කෝපය, ද්වේශය, නොසතුටු බව ප්‍රකාශ කරන්නේ වේද ඒ තැනැත්තා ඒ අකුසල කර්මයෙහි බලයෙන් මරණින් මතු අපායෙහි උපදින්නේය. යම් හෙයකින් මනුෂ්‍යාත්ම භාවයෙහි උපදින්නේ නම් උපදින උපදින භවයක් පාසා විරූප වූයේ වෙති.

### සත්ත්වයා ලස්සන වීමට හේතු

මානවකය, මොලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් ක්‍රෝධ නොකරන්නේ වේද, සිත් තැවුලෙන් යුක්ත නො වන්නේ ද, වරද පෙන්වා දුන් විට නොකිපෙන්නේ වේද, කෝපය, ද්වේශය, නොසතුට බව ප්‍රකාශ නො කරන්නේ වේද හෙතෙම ඒ කුසල කර්මයේ බලයෙන් මරණින් මතු දෙව්ලොව උපත ලබන්නේය. යම් හෙයකින් මනුෂ්‍ය ආත්මභාවයට පැමිණියේ නම් උපදින උපදින භවයක් පාසා ලස්සන වන්නේ ය. රූප සම්පත්තියෙන් යුක්ත වන්නේ ය.

### සත්ත්වයා අල්පේශාක්‍ය වීමට හේතු

මානවකය, මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් ඊර්ෂ්‍යා කරන්නේ වේද, අන්‍යයන්ගේ ලාභ සත්කාර, ගරු කිරීම්, වැඳීම්, පිදීම් ආදීන් හි ඊර්ෂ්‍යා කරන්නේ වේද හෙතෙම ඒ අකුසල කර්මයේ බලයෙන් අපායෙහි උපදින්නේ ය. යම් හෙයකින් මනුෂ්‍යාත්ම භාවය ට පැමිණියේ නම් උපදින උපදින භවයක් පාසා අල්පේශාක්‍ය වන්නේය. පිරිවර ජනයා නොමැත්තෙක් වන්නේය.

### සත්ත්වයා මහේශාක්‍ය වීමට හේතු

මානවකය, මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් ඊර්ෂ්‍යා නොකරන්නේ වේද, එසේම අනුන්ගේ ලාභ සත්කාර, ගරු සත්කාර, වැඳීම් පිදීම් , ආදීන්හි ඊර්ෂ්‍යා නොකරන්නේ වේද හෙතෙම ඒ කුසල කර්මයේ බලයෙන් මරණින් මතු දිව්‍ය ලෝකයෙහි උපත ලබන්නේ ය. යම් හෙයකින් මනුෂ්‍යාත්ම භාවයට පැමිණියේ නම් උපදින භවයක් භවයක් පාසා මහේශාක්‍ය වන්නේය. බොහෝ පිරිවර ඇත්තෙක් ද වන්නේය.

**සත්ත්වයා මහා භෝග සම්පත් ඇත්තෙක් ව උපත ලබන්නට හේතු**

මානවකය, මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් මහණ බමුණන්ට දස දාන වස්තුවෙන් සංග්‍රහ කරන්නේ වේද ඒ කුසල කර්මයේ බලයෙන් මරණින් මතු දිව්‍ය ලෝකයෙහි උපත ලබන්නේ ය. යම් හෙයකින් හෙතෙම මනුෂ්‍යාත්ම භාවයක් ලැබුවේ නම් උපනුපන් හැම භවයකදීම මහා භෝග සම්පත් ඇත්තෙක් වන්නේය. බොහෝ ධනයෙන් යුක්ත වූවෙක් වන්නේය.

**සත්ත්වයා අඥාන වීමට හේතු**

මානවකය, මොලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් මහණ බමුණන් වෙත පැමිණ ස්වාමීනි, කුසල් නම් කවරේද? අකුසල් නම් කවරේද? නිවැරදි දේ කවරේද? ඇසුරු කළ යුතු නොකළ යුතු අය කවරේද? මා හට බොහෝ කාලයක් හිත සුව පිණිස කළ යුතු දෑ කවරේද? ආදී වශයෙන් නො අසන්නේ නම් හෙතෙම ඒ අකුසල කර්මයේ විපාකයෙන් මරණින් මතු දුගතියෙහි උපත ලබන්නේය. යම් හෙයකින් මනුෂ්‍යාත්ම භාවයකට පැමිණියේ නම් භවයක් භවයක් පාසා අඥානයෙක්ම වන්නේය. මෝඩ පුද්ගලයෙක් වන්නේ ය.

**සත්ත්වයා ප්‍රඥාවන්ත වීමට හේතු**

මානවකය, මෙලොව යම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් මහණ බමුණන් වෙත පැමිණ ස්වාමීනි, කුසල් නම් කවරේද? අකුසල් නම් කවරේද? නිවැරදි දේ කවරේද? ඇසුරු කළ යුතු නොකළ යුතු අය කවරේද? මා හට බොහෝ කාලයක් හිත සුව පිණිස කළ යුතු දෑ කවරේද? ආදී වශයෙන් අසන්නේ නම් හෙතෙම ඒ කුසල කර්මයේ බලයෙන් මරණින් මතු දිව්‍ය ලෝකයෙහි උපත ලබන්නේය. යම් හෙයකින් මනුෂ්‍ය ආත්ම භවයකට පැමිණියේ නම් උපදින භවයක් භවයක් පාසා ප්‍රඥාවන්තයෙක්ම වන්නේ ය.

*(චුල්ල කම්ම විභංග සූත්‍රය - මජ්ඣිම නිකාය)*

# වතුර වීදුරුවේ කතාව

වතුර පිරවූ වීදුරුවක් තම අත මත තබාගත් මහාචාර්යවරයෙකු තම දේශනය ආරම්භ කළේය. සියල්ලටම පෙනෙන ලෙස වතුර වීදුරුව ඔසවා ගත් ඔහු මෙසේ පැවසීය..

"මේ වීදුරුවෙ තියෙන වතුර කොච්චර විතර බර ඇද්ද"

"ග්‍රෑම් 50ක්, ග්‍රෑම් 100 ක්, ග්‍රෑම් 125 ක්"ලෙස සිසුන් පිළිතුරු දුන්නේය.

එම පිළිතුරු වලට මහචාර්යවරයා මෙසේ පිළිවදන් දුන්නේය.

"මාත් හරියටම දන්නේ නෑ මේ වීදුරුවෙ කොච්චර වතුර තියෙනවද කියල..ඒත් මට ඔයාලගෙන් එක දෙයක් දැනගන්න ඕනෙ.. මම මේ වතුර වීදුරුව මිනිත්තු කීපයක් මේ විදිහට අල්ලගෙන හිටියොත් මොනව වෙයිද..

"මුකුත් වෙන එකක් නැහැ"සිසුන් පිළිතුරු දුනි..

"හොඳයි එහෙනම් මම මේක පැයක් විතර මේ විදිහට අල්ලන් හිටියොත් මොකද වෙන්නෙ"

"සර්ගෙ අත රිදෙන්න පටන් ගනියි" සිසුන් නැවතත් පිළිතුරු දිනි.

"හරියටම හරි එතකොට මම මේ වතුර වීදුරුව දවසක් විතර අල්ලගෙන හිටියොත් මොකද වෙන්නෙ" මහචාර්යවරයා නැවතත් විමසීය.

"සර්ගෙ අත හිරි වැටිලා දරුණු ලෙඩක් උනත් හැදෙන්න පුළුවන් අනිවාර්යයෙන් ඉස්පිරිතාලෙක උනත් නවතින්න වෙයි"

කටකාර සිසුවෙක් පැවසූ විට සියළුදෙනා සිනාසුනි.

"හරිම හොඳයි.එතකොට මේ හැම වෙලාවකම වීදුරුවෙ බර වෙනස් වුනාද.."

"නැහැ"සිසුන් පිළිතුරු දුනි.

"එහෙනම් අතේ කැක්කුමක් හැදිල මට ඉස්පිරිතාලෙ නවතින්න වෙන හේතුව මොකක්ද.."

සිසුන් ගොලුවිය. පසුව එක් සිසුවෙක් හඬගා මෙසේ කීය.

"සර් ඔය වීදුරුව අල්ලන් ඉන්න නිසා තමා එහෙම දෙයක් වෙන්නෙ.. ඒක නිසා වීදුරුව බිමින් තියන්න"


"හරියටම හරි.

ජීවිතේට එන ප්‍රශ්නත් මේ වගේ තමයි...

මිනිත්තු කිහිපයක් ඔලුව ඇතුලෙ තිබ්බහම අපිට ඒක දරාගන්න පුළුවන්.. ඒත් ඒවා පැයක් විතර ඔලුව ඇතුළෙ තියාගත්තාම රිදෙන්න ගන්නව..

තවත් කාලයක් තියාගත්තාම රිදෙන එක වැඩි වෙනව.. අන්තිමට මුකුත්ම කරගන්න බැරි වෙනවා ඔයාලගෙ ජීවිත වලට එන ප්‍රශ්න ගැන හිතන එක වැදගත්.
ඒත් ඊට වඩා වැදගත් දවස අවසානයේ නින්දට යද්දි ඔබ ඒ ප්‍රශ්න හිතින් අහක් කරගන්න එක..

මතක තියාගන්න.
අපි හැකි හැමවෙලේම "වීදුරුව බිමින් තියන්න" ඕනෙ...



**පාද නමස්කාර පූර්වක කෘතවේදීත්වය සහ ස්තුතිය**

- රමණී කළුබෝවිල මහත්මිය ප්‍රමුඛ 'විඳුසිළු' රංගායතනයට
- මෙත් සවිය පෙරපාසල් ආචාරිණී කේ. පී. නිශාන්ති මහත්මියට
- සාමණේර භික්ෂු පුහුණු වැඩසටහන් හා පෙරපාසල් සම්බන්ධිකා රුශාන්ති දහනායක මහත්මියට
- මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ ගරු පැවිදි අනුශාසක බොරැල්ලේ ශ්‍රී ලංකාරාමයේ විහාරාධිපති අති පූජ්‍ය වීරගොඩ ඤාණ ස්වාමීන්වහන්සේට
- රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති අතිපූජ්‍ය රජවැල්ලේ සුභූති ස්වාමීන්වහන්සේට
- මෙත්සවිය ධර්මදූත ඒකකය ස්ථාපිත ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙන්හි විහාරාධිපති අතිපූජ්‍ය මහාවිහාර වංශික කෝට්ටේ කල්‍යාණී ශ්‍රී ධර්ම මහා සංඝසභාවේ දකුණු පළාතේ ප්‍රධාන සංඝනායක ශාස්ත්‍රපති වැලිවිටියේ සීවලී නාහිමි
- ගාල්ල ඇල්පිටිය විහාරමහාදේවී පිරිවෙන්හි පරිවේනාධිපති අතිපූජ්‍ය මානම්පිටි විජාතහිමි ඇතුළු සිව්දෙසින් වැඩමකල ආර්‍ය මහා සංඝරත්නයට
- අජිත් සුදක්සන/රමණී කුරුප්පු මහත්මිය ඇතුළු කළුතර ශාඛාවට
- ප්‍රසන්න චන්දන බණ්ඩාර නිවේදක මහතාට
- මෙත් සවිය ප්‍රධාන කමිටුව ඇතුළු සියළු අනුකමිටු සඳහා
- දිනකර මුද්‍රණාලාධිපති එම්.කේ. ප්‍රියන්ත මහතාට
- මෙත් සවිය 21වන සංවත්සර මහා සමුළුව සාර්ථක කර ගැනීම සඳහා ආශිර්වාදකල, වදනකින් හෝ ශක්තියක් ලබාදුන් දැක බලා සතුටු සිත් උපදවාගත්තාවූ සියළු සත්පුරුෂයන්හට හදවතින්ම කෘතවේදී ස්තුතිය පුදකරමු...!



**මියගිය මෙත්සවිය සාමාජිකයන්ට සහ මෙත්සවිය සාමාජිකයන්ගේ පවුල් වල මියගිය ඥාතින් සඳහා 2024 දෙසැම්බර් 01 වන ඉරු දින බොරැල්ල ශ්‍රී ලංකාරාම විහාරස්ථානයේදී පවත්වන ලද සාංඝික දානමය පිං පැමිණවීමේ කෘතවේදී පිංකම සඳහා ආධාර කළ පිංවතුන්**

## දානමය පුණ්‍ය කර්මය සඳහා ආධාර කළ පිංවතුන්

**1) බත්**

රතු කිලෝ 2 බටපොලැල් - මෙන්ඩිස් මයා
කහබත් - කුමාරි මහත්මිය
සුදු කිලෝ 3 සුවදැල් - සහනි මිය, ධම්මිකා මිය
අසුදා සහල් කිලෝ 2 - සෝමා දීගල්ල මිය

**2) ව්‍යංජන**

කජු - මංජුල මයා
අල හොදි - හේමන්ති මිය
කිරි හොදි - සන්ධ්‍යා (ලේක් හවුස්)
බිම්මල් - ප්‍රියන්ති රාජපක්ෂ මිය
ගොටු කොල - තනූජා සමන්ති මිය
වැටකොළු - සඳමාලි මිය
කරවිල සම්බෝල - ඉෂාරා ජයර්වර්ධන මිය
පොලොස් - ජයසිංහ මිය,
සුදු ලූණු - නිරෝෂා රාමනායක මිය
ඇඹරැල්ල - ලලන්ති මිය
ඉස්සො - නිලූකා ජයසිංහ මිය
මාළු - නිලක්ෂි ගුණසෙකර මිය
සුප් - ඉන්ද්‍රලතා රාජපක්ෂ මිය, ලේඛා ගංගානි මිය
කොස් මැල්ලුම් - ජී. විජේතුංග මිය
පොල් සම්බෝල - ජී. විජේතුංග මිය
කතුරු මුරුංගා කිරිහොදි - නදීකා මිය
කැරන් කොකු, ටෝෆු, මියන දළු, - චේනුක මයා, මොනිකා මිය
එළවළු තම්බා - චමරි යාපා මිය
කරවිල සම්බෝල - ජී.ජී සෝමවතී මිය
මඤ්ඤොක්කා - ගයනි විර්දශනා මිය

**3) පලතුරු**

අඹ, අන්නාසි, පේර
ගස්ලබු, කොමඩු - වික්‍රම මහතා
දෙළුම් - අප්සරා මිය
මිදි - නදීකා මනෝරි මිය
කෝලිකුට්ටු - තමාරා සමරවීර මිය
දෙළුම් - අප්සරා මිය
මිදි - නදීකා මනෝරි මිය

**4) කැවිලි**

තල -
කොණ්ඩ කැවුම් - නේපාලි මිය
වඩේ - නිරංජලා සරෝජනී මිය

**5) අතුරුපස**

මීකිරි /පැණි - චම්පාවෝ මෙය
මී පැණි/ කිරි - ශ්‍යාමා සමරධීර මෙය
අයිස්ක්‍රීම් - ශාන්ති මිය
ජෙලි - නිරෝෂා මිය
බිස්කට් පුඩිං - අනුෂ්කා මෙය
වතුර බෝතල් 25 - අප්සරා මිය
දෙළුම් ගෙඩි 05 - අප්සරා මිය
තැඹිලි - මෙනුර මිය
වටලප්පන් - මේනකා ජයමාන්න මිය

## පිරිකර පූජාව සඳහා ආධාර කළ පිංවතුන්

මහාචාර්ය චන්දන ජයරත්න ගුරුතුමා
නොමේෂ් ද සිල්වා මයා
අමිල නාගසිංහ මයා
හසිත් ශ්‍රීමන්ත
රමිත් ශ්‍රීමන්ත මයා
නිමල් වික්‍රමසිංහ මයා
කුමදුනී අබේසිංහ
ලියන්සා / සමීර මයා
අතුල නානායක්කාර මයා
අජිත් ගමගේ මයා
පණ්ඩුල ගුණසේකර මයා
ලෂීන් ප්‍රනාන්දු මයා
කුජන රත්නායක
චිත්‍රා රත්නායක මිය
නිසංසලා සමරතුංග මෙනවිය
කෝසල එදිරිසිංහ මයා
නිමේෂ් සගින්ත මයා
දයා රණසිංහ මයා
අමල් බණ්ඩාර මයා
උපුල් පතිරණ මයා
ලේඛා ගංගානි මිය
පත්මසිරි දහනායක මයා
නිරෝෂා පෙරේරා මිය
එම්. කේ. ප්‍රියන්ත මයා
මේරිනෝනා හෙට්ටිවත්ත මිය
නිරංජිකා පතිරගේ මිය
ඉනෝකා කොතලාවල මෙනවිය
කුසුම් එදිරිසූරිය මිය
ක්‍රිෂාන්ති ප්‍රියදර්ශනී මිය
ශ්‍රියාණි චන්ද්‍රලතා මිය
එස්. එම්. වික්‍රමසිංහ මිය
ස්වර්ණා ගුණසේකර මිය
පබා ද සිල්වා මෙනවිය
ඉන්ද්‍රාණි සෙනෙවිරත්න මිය
අනෝමා ඒකනායක මිය
සුරංජිත් ජිනේන්ද්‍ර මයා
එම්. එච් විමලාවතී මිය
තුෂාරි ප්‍රියංකා මිය
දේවිකා කරුණාසේන මෙනවිය
ඒ තිළිණි චාමරි මිය
මෙනුර ඩයස් මයා
විශ්වනාත් අපෝන්සු මයා
ගිහානි රංගිකා මිය
ඩී. ඒ. සීතා මාලනී මිය
සසිකලා නිසංසනී මිය
ධම්මිකා මහත්මිය
විරාජ් ප්‍රසංග ප්‍රනාන්දු
බුද්ධික ජයසිංහ මයා
කේ. බී. ප්‍රේමාවතී මිය
ආර්. පී. ජී. ඉන්ද්‍රලතා මිය
රංජන් රණතුංග ඇතුළු පිරිස
ඩී. ගනේෂ් මයා
දේවිකා කරුණාසේන මෙනවිය
දෙව්නිම් ගමගේ මෙනවිය
ශ්‍රියාණි මාවෙලගේ මිය
කුමුදුනී පෙරේරා මිය
ලංකා පද්මිණි මිය
තමරා සමරවීර මිය
ලලන්ති ද සොයිසා මිය
මේනකා ජයමාන්න මිය

මෙත් සවිය ජූනි කණ්ඩායම- දනූෂා ඉෂානි හසංක කුසංග මහේෂ් පවිත්‍රා චලනි තිලකරත්න ගීතානි සුජීවා ස්වර්ණා වසන්ත ගිහානි නිලූෂ ශිරාණි පූර්ණිමා චන්දන කාන්ති මිය

## මුදල් පරිත්‍යාග කළ පිංවතුන්

ජේ. ඒ. ආර්. ජයන්ත මයා
විශ්වනාත් මයා
අත්තනායක මිය
ප්‍රියන්ත වීරකෝන් මයා
එම්.එම් තනුජා සමන්ති මිය
කාන්ති විජේන්ද්‍ර මයා
දීප්ති බණ්ඩාර මිය
ඉන්ද්‍රාණි සෙනවිරත්න මිය
ස්වර්ණා ගුණසේකර මිය
මාලා හෙට්ටිආරච්චි මිය
නදීෂා නානායක්කාර මිය
පී. එම්. සේනාධීර මයා
ජයන්ති ප්‍රනාන්දු මිය
තේජා පද්මාංගනී මිය
තේජා පද්මාංගනී පුතා
ඉන්ද්‍රානි හේමලතා මිය
ලක්ෂ්මන් රණවීර මිය
ඉරෝෂා රාමනායක මිය
දිල්ෂාන් ජයසූරිය මිය
ඉරේෂා වික්‍රමරත්න මිය
නන්දනී උක්වත්ත මිය
කපිල තුෂාන්ත මයා
සුදර්ශී වරුණිකා මිය
එස්. සමරත්න මයා
නයනා ගම්ලත්ගේ මිය
චමෝදි සඳුනිකා මිය
ඩේසිකා සඳමාලි මිය
ෆිම්රෝස් මිය
ජය ශාන්ති මිය
දමිත් ලසන්ත මිය
සුපුන් මයා
හර්ෂනී පතිරගේ මිය
සමන්තිකා පතිරගේ මිය
චම්පිකා රෝෂණී මිය
කේ. එන්. ලක්මිනි මිය
අතුල නානායක්කාර මිය
පී. පී. පෙරේරා මයා
කිත්මිණි මිය
පියල් මයා
මුදිතා මිය
මාලනී ගුරුගේ මිය
ඒ. ඩබ්. අමිතා පද්මිණි මිය
පද්මිණි කුමාරසිරි මිය
සරත් කුමාර ජයර්වර්ධන මිය
මියුරියල් පෙරේරා මිය
ශ්‍යාමලී අමරසිංහ මිය
එම්. ප්‍රිසිකා පීරිස් මිය
ඩබ්. සී. වී. එල්. වික්‍රමාරච්චි මිය
කුසුම් දහනායක මිය
ඩබ්. ඒ. කේ. ජානකී මිය
චූලනී ජයන්ති මිය
එම්. කේ. ප්‍රියන්ත මයා
මානෙල් අමරවික්‍රම මිය
සමිරු අපොන්සු මයා
විශ්වනාත් අපොන්සු මයා
නිමේෂ් ශෂින්ත මයා
ශානිකා වනිගසේකර මිය
සාගරිකා වීරසිංහ මිය
ශර්මිලා හංසනී මිය
ගයනි ගමගේ මිය
දීපාල් ආටිගල මිය
සන්ධ්‍යා මිය
දීපිකා මිය
අනෝමා මිය
සේපාලිකා මිය
කේ.පී.ජයසිංහ මිය
මල්කාන්ති පෙරේරා මිය
සී. අයි මෙන්ඩිස් මහතා
අයි. ඕ. සී. පුෂ්පකුමාර මහතා
තිලකසිරි මහතාගේ බිරිඳ
මිල්ඩා මිය
ශානිකා සමරවික්‍රම මිය
සෝමා දීගල්ල මිය

## මෙත්සවිය මියගිය සාමාජිකයන්ගේ සහ ඥාතීන් වෙත පින් අනුමෝදන් කිරීමේ පුණ්‍ය කර්මය 2024 දෙසැම්බර් 01.

**මෙම දානය පැවැත්වීමේ අරමුණ මෙත් සවිය සංගමයේ අපවත් වී වදාළ ස්වාමීන් වහන්සේලාට සහ මියගිය සාමාජිකයන්ට සහ සාමාජිකයන්ගේ මියගිය ළඟම ඥාතීන්ට පින් අනුමෝදන් කිරීම පිණිස සහ සුජීවත්ව සිටින සියලුම සාමාජිකයින්ට ආශිර්වාද පිණිසයි.**

1 අපවත් වී වදාළ මෙත්සවිය ගරු අනුශාසකව වැඩ සිටි අමරපුර මහා නිකායේ උත්තරීතර මහා නායක කොටුගොඩ ධම්මාවාස ස්වාමීන් වහන්සේ
2 අපවත් වී වදාළ මෙත් සවිය ගරු අනුශාසකව වැඩ සිටි අමරපුර මහා නිකායේ ගරු අධිකරණ සංඝනායක පූජ්‍ය අහංගම ආනන්ද නායක ස්වාමීන් වහන්සේ
3 මෙත් සවිය ගරු සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ මෑණියන් වූ, ඩී. ඒ. ජයරත්න මාතාව සහ එම පියාණන්ට

4 ලහිරු පැතුම් උදාර වික්‍රමගේ
5 සුගතදාස සමරවීර
6 කේ. මහින්ද සිල්වා
7 ලීලානන්ද රාමනායක
8 අරිසෙන් අහුබුදු ගුරීන් සහ සඳා අහබුදු මහත්මිය
9 ජී. ජී. තිලකසිරි මහතා
10 ලිලාන් සුරංග මහතා
11 හේමන්ත ජයසිංහ මහතා
12 නන්දනී පෙරේරා මහත්මිය
13 ලාල් මෝතා මහතා
14 වී. ජී. අයි. විතාන මහත්මිය
15 හිල්ඩා නොන්සි අපොන්සු මාතාව
16 ස්වර්ණා සුවාරිස් මහත්මිය
17 කේ.ඩී. කරුණාදාස මහතා
18 එච්. ඒ. සොමදාස මහතා
19 පත්මා පුංචි හේවා මහත්මිය
20 රංජිත් මුණසිංහ මහතා
21 ඩබ්. ජී. මෙන්ඩිස් මහතා සහ මහත්මිය
22 ජේ. එම්. ජයසේකර මහතා සහ මහත්මිය
23 ආර්. මාලනී ප්‍රනාන්දු මහත්මිය
24 ඊ.ඩී මල්ලිකා මහත්මිය
25 චන්දන තිලක් රාජපක්ෂ මහතා
26 අයිමා මහත්මිය
27 සාවිත්‍රි වික්‍රමසිංහ මහත්මිය
28 මාලනී සේනානායක මහත්මිය
29 පුෂ්පා විජේතුංග මහත්මිය
30 ඩබ්. ඒ. නන්දාවතී මහත්මිය
31 සරත් රංජිත් සමරවීර මහතා
32 ආරියදාස විජේතුංග මහතා
33 රෝසසිං මුණසිංහ මහත්මිය
34 සමරපාල රාජපක්ෂ මහතා
35 හෙන්ද්‍රි පෙරේරා මහතා
36 ධර්මදාස පෙරේරා මහතා
37 රෝලන්ඩ් ප්‍රනාන්දු මහතා
38 ජොසපින් පෙරේරා මහත්මිය
39 මැතිල්ඩා ෆොන්සේකා මහත්මිය
40 ඇන්ඩෘ ජයමහ මහතා
41 මාලිනී හේමලතා මහත්මිය
42 ඩේවිඩ් පෙරේරා මහතා
43 හේමා පිරිස් මහත්මිය
44 ධර්මසේන පෙරේරා මහතා
45 ඇල්බින් කළු ආරච්චි මහතා
46 සීලවතී කනම්පැල්ල මහත්මිය
47 තේමිස් උඳුගොඩ මහතා
48 ඩබ්. කුසුමාවතී මහත්මිය
49 විල්ටන් ද සොයිසා මහතා
50 ස්වර්ණා වර්ණ කුලසූරිය මහත්මිය
51 ජයලත් කුරුප්පු මහතා
52 පර්ල් සංගක්කාර මහත්මිය
53 විල්බට් මහතා
54 රොමලින් මහත්මිය
55 සුගතදාස නැලිගම මහතා
56 පියසීලි වගවත්ත මහත්මිය
57 ලක්ෂ්මන් නැලිගම මහතා
58 නන්දාවතී වේරගම මහත්මිය
59 ඕ.කේ. පීතර අප්පුහාමි මහතා
60 පුසුබි හතුරුසිංහ මහත්මිය
